විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சு

MINISTRY OF POWER AND ENERGY

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயற்பாட்டு அறிக்கை

Annual Performance Report

2022

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය
වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2022

විදුලිබල අංශය
අංක 437, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් අංකය - 0112574741
වෙබ් අඩවිය - www.powermin.gov.lk

බලශක්ති අංශය
අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.
දුරකථන අංකය - 011 2370033
ෆැක්ස් අංකය - 0112372115
වෙබ් අඩවිය - www.energymin.gov.lk

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
වැය ශීර්ෂ අංකය 119

අන්තර්ගතය

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය		**01**
1.1	හැඳින්වීම	01
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	04
1.3	අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්	05
1.4	සංවිධාන සටහන	06
1.5	අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ	08
1.6	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන	10
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	11
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා අනාගත දැක්ම		**14**
2.1	විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාව	14
2.2	2022 විදුලිබල ජනනය	15
2.3	විදුලි ඉල්ලුම සහ පාරිභෝගික වර්ධනය	16
2.4	විදුලි ජනනය ඉහළ නැංවීම	16
2.5	විදුලි සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සංවර්ධනය	20
2.6	දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධයෙන් ගනුලැබූ ක්‍රියාකාරකම්	20
2.7	පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	21
2.8	2022 වර්ෂයේ අයවැය යෝජනා	21
2.9	2022 වසර තුළ රට තුළ පැවති ඉන්ධන අර්බුදය විසඳීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග	22
2.10	රටේ බලශක්ති සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් අංශය සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම	25
2.11	යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති	28
2.12	ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම සහ අලෙවි කිරීමේ ප්‍රගතිය	31
2.13	ඛනිජ තෙල් සහ ස්වභාවික වායු ගවේෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය	33
2.14	2022 වසර තුළ දී මුහුණ දුන් අභියෝග හා ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග	34
2.15	2023 සඳහා අනාගත සැලසුම්/වැඩසටහන්	36
පරිච්ඡේදය 03 - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය		**38**
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	39
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	40
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	41
3.4	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	42
3.5	වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය	42
3.6	මු.රෙ.208 ප්‍රකාරව, ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	42
3.7	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	43
3.8	විගණකාධිපතිවරයාගේ වාර්තාව	43
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක		**44**
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	44

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය **46**

5.1 හඳුනාගෙන ඇති අදාළ තිරසාර සංවර්ධන අරමුණු 46
5.2 තිරසාර සංවර්ධන අරමුණු ජයග්‍රහණ සහ අභියෝග 46

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **48**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 48
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයෙහි බලපෑම 48
6.3 මානව සම්පත් සංවර්ධනය 49

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **50**

වගු නාමාවලිය

වගුව 1.1 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති 11
වගුව 2.1 ජාතික විදුලිබල ජාලයේ සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව (2023 - මාර්තු) 14
වගුව 2.2 විදුලි පාරිභෝගිකයන් (2022 වසරේ දෙසැම්බර් වනවිට) 16
වගුව 2.3 2022 දෙසැම්බර් වනවිට සූර්ය පියසි වැඩසටහන්හි ප්‍රගතිය 18
වගුව 2.4 ඉන්දීය ණය ආධාර යටතේ ආනයනය කරන ලද ඉන්ධන තොග ප්‍රමාණයන් 23
වගුව 2.5 තෝරාගත් ඉන්ධන පිරවුම්හල් මගින් කෘෂිකාර්මික අංශය සඳහා ඩීසල් සැපයීම (2022 - 2023) 23
වගුව 2.6 ධීවර වරායන් සඳහා ඩීසල් සැපයීම (2022 ජනවාරි 01 - 2023 අප්‍රේල් 25) 23
වගුව 2.7 පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලාභය කෙරහි බලපෑම 27
වගුව 2.8 ජාතික ඉන්ධන අවසරපත මගින් සිදුකල ගනුදෙනු සාරාංශය (2022 අගෝස්තු 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා) 28
වගුව 2.9 ජාතික ඉන්ධන අවසර පත මගින් ඉන්ධන නිකුත් කිරීම (වාහන වර්ගය අනුව) 2022 අගෝ: 01 සිට 2022 දෙසැ: 31 දක්වා 28
වගුව 2.10 ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීරණය සංවර්ධනය කිරීම 29
වගුව 2.11 කොලොන්නාව පර්යන්තයේ ටැංකි අලුත්වැඩියා කිරීමේ ප්‍රගතිය (2022.12.31 දිනට) 30
වගුව 2.12 බොරතෙල් ආනයනය (2018 - 2022) 31
වගුව 2.13 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන ආනයනය (2020 - 2022) 31
වගුව 2.14 සපුගස්කන්ද තෙල් පිරිපදුවේ කාර්ය සාධනය -2022 32
වගුව 2.15 ලංකා ඛනිජතෙල් සංස්ථවේ ඉන්ධන පිරිපහදුවෙහි නිෂ්පාදන ප්‍රමාණය (මෙ. ටො.) (2018 - 2022) 32
වගුව 2.16 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අලෙවිය (මෙ. ටො.) (2019 - 2022) 33
වගුව 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 44
වගුව 5.1 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණ 46
වගුව 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 48
වගුව 6.2 අමාත්‍යාංශය මඟින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2022 49

ප්‍රස්තාර

ප්‍රස්ථාරය 2.1	සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව-2022	14
ප්‍රස්ථාරය 2.2	පුනර්ජනනීය බලශක්ති ධාරිතාව (මෙගාවොට්)	15
ප්‍රස්ථාරය 2.3	අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ධාරිතා එකතු කිරීම් (මෙගාවොට්)	15
ප්‍රස්ථාරය 2.4	විදුලිබල ජනන මිශ්‍රණය - 2022	15
ප්‍රස්ථාරය 2.5	අනෙකුත් පුනර්ජනනීය බලශක්ති මඟින් විදුලි ජනනය (ගි.වො.පැ.)	15
ප්‍රස්ථාරය 2.6	සූර්ය පියසි මඟින් විදුලි ජනනය (ගි.වො.පැ.)	16
ප්‍රස්ථාරය 2.7	විදුලි පාරිභෝගිකයන් - 2022	16
ප්‍රස්ථාරය 2.8	බනිජතෙල් නිෂ්පාදන විකුණුම් මිල සංශෝධන (2021 ජූනි - 2023 මාර්තු 31)	27
ප්‍රස්ථාරය 2.9	පිරිපහදු කළ බනිජතෙල් බැරලයක මාසික (සිංගප්පූරු ප්ලැට්ස්) මිල ගණන් (2022 ජනවාරි - 2023 මාර්තු)	27

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

කෝවිඩ් වසංගතයත් සමඟ ලෝක ආර්ථිකයේ ඇතිවූ ගැටලුකාරී තත්ත්වය සහ 2022 වසර තුළ අප රටේ සමාජ, ආර්ථික හා දේශපාලනික වෙනස්වීම් හේතුවෙන් ජන ජීවිතය මහත්සේ බලපෑමට ලක් විය. විශේෂයෙන්ම රට මුහුණදුන් විදේශ විනිමය අර්බුදයට විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය නතුවීමෙන් පහත අභියෝගයන්ට මුහුණ දුන් අතර එම අභියෝග ජය ගැනීම සඳහා උචිත උපායමාර්ග හඳුනා ගැනීම අප අමාත්‍යාංශයට පැවරුනු විශේෂ කාර්යභාරයක් විය.

- ගෝලීය වෙළෙඳපොලේ බනිජ තෙල් මිල ගණන් ඉහළ යාම සහ ඇමරිකානු ඩොරලයට සාපේක්ෂව රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීම 2022 වසර ආරම්භයේ සිට දක්නට ලැබුණු අතර ඒ හේතුවෙන් ඉන්ධන ආනයනය සඳහා ඉහළ පිරිවැයක් දැරීමට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වීම. තවද විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය දේශීය බැංකු පද්ධතිය තුළින් සම්පාදනය කර ගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වීම.

- විදේශ විනිමය අර්බුදයට සමගාමීව ශ්‍රී ලංකාව ණය ශ්‍රේණිගත කිරීම් හි පහළ මට්ටම් කරා පැමිණීමත්, දිගුකාලීන ණයපදනමින් මෙතෙක් ඉන්ධන සැපයුම් කළ සැපයුම්කරුවන්ගේ ණය නොපියවීමත් වැනි සාධක හේතුවෙන් ඉන්ධන සැපයීම සඳහා ජාත්‍යන්තර සැපයුම්කරුවන් මැලිකමක් දැක්වීම. එමෙන්ම, ඉදිරිපත් වූ අතලොස්සක් වන සැපයුම්කරුවන්ද ලංසු කොන්දේසිවලින් පරිබාහිරව ඔවුන්ගේ නව කොන්දේසි සහිතව ලංසු ඉදිරිපත් කිරීම.

- ඉන්ධන පිරිවැය ආවරණය වන පරිදි, පිරිවැයට සමානුපාතික විකුණුම් මිලක් වසරේ මුල් භාගය දක්වා තීරණය කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉන්ධන ආනයනය සහ අනෙකුත් බලශක්ති සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සපයා ගැනීම ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට දුෂ්කර කාර්යයක් වීම.

- රට තුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් සංස්ථාව සතුව තිබූ සීමිත ඉන්ධන ප්‍රමාණය පාරිභෝගිකයින් අතර බෙදාහැරීමේදී විවිධ බලපෑම්වලට නතුවීමෙන්, දිවයින පුරා දීර්ඝ ඉන්ධන පෝලිම් නිර්මාණය වීම.

- විදේශ විනිමය අර්බුදය හේතුවෙන් විදුලි බලාගාර සඳහා අඛණ්ඩව ඉන්ධන සහ ගල් අඟුරු සැපයීමට නොහැකි වීම හා විදුලිබලාගාරවල ජනන යන්ත්‍ර බිඳවැටීම සහ ජල විදුලිය නිපදවීමට භාවිතා කරනු ලබන ජලාශවල ජල මට්ටම සීඝ්‍රයෙන් අඩු වීම හේතුවෙන් අඛණ්ඩව විදුලිබලය උත්පාදනය කර බෙදා හැරීමට බාධා ඇති වූ අතර ඉන් නොනැවතී දිනකට පැය 13 ක් පමණ විදුලිබල කප්පාදුවක් දක්වා වර්ධනය විය. ජනතාවට අත්‍යාවශ්‍ය වන බලශක්ති ප්‍රභවයක් වන විදුලිබලය එලෙස අඛණ්ඩව සැපයීමට අපහසු වූ බැවින් විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය කෙරෙහිත් අනෙකුත් විවිධ සේවාවන් සපයනු ලබන ආයතන කෙරෙහිත් ගෘහස්ත පාරිභෝගිකයන් කෙරෙහිත් අවාසිදායක ආකාරයේ බලපෑම් එල්ලවිය.

එසේ පැන නැඟුනු ගැටලුකාරී වාතාවරණයෙන් ජනතාව මුදා ගනිමින් යම් සහනදායී මාවතකට ප්‍රවිශ්ට කරවීම සඳහා අමාත්‍යාංශය 2022 වර්ෂය තුළදී ප්‍රධාන වශයෙන් පහත විකල්ප ක්‍රමෝපායන් ක්‍රියාවට නංවන ලදී.

- රට තුළ අඛණ්ඩ ඉන්ධන සැපයුම තහවුරු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැපයුම්කරුවන් වෙත ගෙවීම් සහතික කිරීම යටතේ ඉන්ධන ප්‍රසම්පාදනය කිරීම, අනේවාසික රුපියල් (NRR ESCROW) ගිණුම් ක්‍රමය හරහා ගෙවීම හා බනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර ගබඩාගත ටැංකිවලින් නිකුත් කිරීමේදී (Ex-storage Modality) ගෙවීම් ක්‍රමවේදය යන විකල්ප ගෙවීම් කොන්දේසි

යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට අවස්ථාව සැලසීම, ඉන්ධන සැපයීම සඳහා නව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නොකැඳවූ යෝජනා (Unsolicited Proposals) ඇගයීමට ලක් කර තෝරා ගන්නා සැපයුම්කරුවන්ගෙන් ඉන්ධන ආනයනය සඳහා පියවර ගැනීම සිදු කරන ලදී.

- විදේශ විනිමය අර්බුදයට පිළියමක් ලෙස මෙරට ඛනිජ තෙල් වෙළෙඳපොලට කිර්තිමත් විදේශීය සමාගම්වලට පිවිසීමට අවස්ථාව සලසා දෙන ලද අතර ඛනිජ තෙල් අලෙවිකරුවන් හට ඛනිජ තෙල් පිරිවැය ආවරණය කර ගැනීම සඳහා පිරිවැය ආවරණය වන ඉන්ධන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

- තවද පවතින සීමිත ඉන්ධන තොග පාරිභෝගිකයන් අතර සාධාරණව බෙදා හැරීම සඳහා අමාත්‍යාංශයේත්, රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ගේත් දායකත්වය ඇතිව "ජාතික ඉන්ධන අවසර පත්‍රය" හඳුන්වා දෙන ලදී. එමඟින් සාමාන්‍ය ප්‍රවාහන කටයුතු සඳහා සෑම වාහනයකටම සහතික කරන ලද ඉන්ධන ප්‍රමාණයක් සතිපතා ලබාදීමට හැකි විය. එමෙන්ම පොදු ප්‍රවාහනය ඇතුළු අනෙකුත් සංවර්ධන කාර්යයන් සඳහා ඉන්ධන අවශ්‍යතා වෙන් වෙන් වශයෙන් හඳුනා ගනිමින් ඒ සඳහා ප්‍රමාණවත් ඉන්ධන ලබාදීමට කටයුතු කරන ලදී. තවද, දින කිහිපයකට අවශ්‍ය අවම ඉන්ධන සංචිතයක් ආරක්ෂිත තොගයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

- වසර මැද සිට, විදුලිබලය නැවත යථා පරිදි උත්පාදනය කිරීමට හැකියාව ලැබීමත්, තාප බලාගාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකිවීමත් සුළං සහ සූර්ය බලශක්තිය කෙරෙහි වැඩි ප්‍රවනතාවක් දක්වීමත් හේතුවෙන් ආරම්භයේදී පැය දහතුනක් (13) පමණ දීර්ඝ විදුලිය කප්පාදුව 2022 වසර අග වන විට පැය දෙකහමාරක් දක්වා අඩු කිරීමට හැකි විය. තවද වර්තමානය වන විට විදුලි කප්පාදුවකින් තොරව රට තුළ අඛණ්ඩව විදුලිය සැපයුමක් පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

- විදුලිබල ක්ෂේත්‍රයට අදාළ වන විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ද එවකට පැවති ආර්ථික අර්බුදය අහිතකර ලෙස බලපා ඇත. කෙසේවුවද, 2022 වසරේ සිට පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි රජය මඟින් සුවිශේෂී අවධානයක් යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2030 වසර වන විට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මඟින් විදුලිය ජනනය 70% ක් දක්වා ඉහළ දැමීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. එමෙන්ම විදුලිබල ක්ෂේත්‍රයට අදාළවන ජනන සැලසුම් ක්‍රියාත්මක කිරීම ඇතුළු සංවර්ධන ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය නියාමන කටයුතු ද අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී.

- ජනතාවගේ විදුලිබල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ගන්නා ලද පියවරක් වශයෙන් බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය ඉදිකර 2022 වසරේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලදී. එමෙන්ම මන්නාරම සුළං විදුලි බලාගාරය ඉදිකර ක්‍රියාත්මක කිරීමටද මෙම වසරේදී පියවර ගන්නා ලදී. මෙය පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහළ නැංවීමට හේතු විය.

- ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ ගවේෂණ කටයුතු හා නියාමන කටයුතු ඉටුකිරීමේ අරමුණෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ කටයුතුද 2022 වසර තුළ දී සාර්ථකව ආරම්භ කරන ලද අතර ඊට අදාළ රෙගුලාසිද සකස්කර, එම කාර්යයන් බලාත්මක කිරීමට කටයුතු කරන ලදී.

අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රියාත්මක ආයතන වන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක බලශක්ති නියාමන සභාව, එල්.ටී.එල්. හෝල්ඩින්ස් සමාගම, ලංකා ගල් අඟුරු පුද්ගලික

සමාගම සහ ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය සහ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගමේ දායකත්වය සහ කැපවීම උක්ත කාර්යභාරය සිදු කිරීමේදී අමාත්‍යාංශය වෙත ලැබුණි.

අප රටේ විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය තුළ පැවති ගැටලු සහගත තත්ත්වය බොහෝ දුරට මගහැර ගනිමින් ජනතාවගේ බලශක්ති අර්බුදය විසඳාලීම වෙනුවෙන්, අමාත්‍යාංශයේ සෑම අංශයක්ම මනා කැපවීමෙන් කටයුතු ඉටුකරන ලදී. පොදුවේ සලකනු ලැබූකල, අප රටේ ආර්ථික, සමාජයීය කටයුතු සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන විදුලිබලය හා අනෙකුත් බලශක්තීන් අඛණ්ඩව සැපයීමේ ක්‍රියාවලිය වෙනුවෙන් 2022 වසර තුළ සිදු කරන ලද කාර්යයන් හි ප්‍රගතිය මෙම වාර්තාව තුළින් ඉදිරිපත් කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

විදුලිබල අංශය

දැක්ම

"තිරසාර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා ඇවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම

බලශක්ති අංශය

දැක්ම

"ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

මෙහෙවර

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

අරමුණු

- වසර 2030 වන විට මෙරට විදුලි ජනනයෙන් 70% පුනර්ජනනීය බලශක්තිය මඟින් ලබා ගැනීම.
- පුනර්ජනනීය බලශක්තියේ උපරිම සංවර්ධනය සමඟින් 2025 වන විට රටේ විදුලි ජනන ධාරිතාව දැනට පවතින 4,809 MW සිට 7,629 MW දක්වා වැඩි කිරීම.
- සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම

  2025 වන විට 220 kV ජාලය 799 km සිට 1,300 km දක්වා

  2025 වන විට 132 kV ජාලය 2,361 සිට 3,000 km දක්වා
- ගුණාත්මක සේවාවක් සැපයීමට සහ 100% ගෘහ විදුලිය මට්ටම පවත්වා ගැනීමට බෙදාහැරීමේ ජාලය වැඩිදියුණු කිරීම
- 2025 වන විට පද්ධතියේ තාක්ෂණික හා වාණිජමය පාඩු 9% සිට 8% දක්වා අඩු කිරීම
- දේශීයව විදුලි උපකරණ නිෂ්පාදනය දිරිමත් කිරීම මඟින් රටේ විදුලිබල පද්ධතිය සුහුරු ජාලය (Smart Grid) බවට පරිවර්තනය කිරීම
- ඉන්ධන සැපයුම් දාමයෙහි ගුණාත්මක බව හා විශ්වසනීයත්වය තහවුරු කිරීම.
- කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතාව ප්‍රවර්ධනය කිරීම.
- ආරක්ෂිත හා වඩාත් කාර්යක්ෂමව ඉන්ධන ගබඩා පහසුකම් තහවුරු කිරීම හා රට පුරා ඉන්ධන බෙදාහැරීම තහවුරු කිරීම.
- වසර 2050 දී කාබන් විමෝචනය ශූන්‍ය කළ රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා ප්‍රමුඛ දායකයකු බවට පත්වීම.
- 2023 වන විට පෙට්‍රල් සහ ඩීසල් සඳහා යුරෝ VI (EURO VI) ප්‍රමිතීන් හඳුන්වා දීම තුළින් ඒවායේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීම.
- වසර 2030 වන විට දේශීය ඛනිජ තෙල් සහ ස්වභාවික වායු නිෂ්පාදනය ප්‍රශස්ථ කිරීම මඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ස්වයංපෝෂිත භාවයේ හවුල්කරුවකු වීම.
- ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- 2026 වන විට රටේ ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම මෙරට පිරිපහදු මඟින් නිපදවීම.

1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා විදුලිබල හා බලශක්ති විෂයයට සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- සුර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මඟින් පුනර්ජීවන බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය.
- ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම.
- බලශක්ති කාර්යක්ෂමතාව ඇති වන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.
- දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- විදුලි සම්ප්‍රේෂණය හා බෙදාහැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
- ජනනය කරනු ලබන විදුලිබලය උපරිම කාර්යක්ෂමතාවය සහිතව භාවිතා කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.
- විදුලි ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩුකිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
- හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
- ග්‍රාමීය විද්‍යුතනය.
- ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හා ස්වභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම ගබඩා කිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
- ඛනිජ තෙල් හා ස්වාභාවික ගෑස් ගවේෂණය හා ඒ ආශ්‍රිත කටයුතු.
- ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් හා අතුරු නිෂ්පාදන කටයුතු, තොග පවත්වා ගැනීම හා නිෂ්පාදනය හා බෙදාහැරීම.
- ඉන්ධන සැපයීම හා බෙදාහැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- බලශක්ති සම්පත් පාලනය, නියාමනය හා උපයෝගි කරණය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය.
- නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදමින් විදුලිබලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති සහ සූර්ය කෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම.
- කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් බලශක්ති උත්පාදනය ඉහළ දැමීම.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම

1.4 සංවිධාන සටහන (විදුලිබල අංශය)



බලශක්ති අංශය


ගරු අමාත්‍යතුමා
ගරු රාජ්‍ය අමාත්‍යතුමා
ගරු රාජ්‍ය අමාත්‍යතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන) 01
අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) 01
අතිරේක ලේකම් (සංවර්ධන) 01
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) 01
ප්‍රධාන මූල්‍ය නිලධාරි 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) 01
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) 01
ප්‍රධාන ඉංජිනේරු 01
අධ්‍යක්ෂ (සැලසුම්) 01
ප්‍රධාන ගණකාධිකාරි 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01
සහකාර ලේකම් (පාලන) 01
නීති නිලධාරි 02
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) 01
සහකාර ලේකම් (සංවර්ධන) 01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) 01
ගණකාධිකාරි 01
පරිපාලන නිළධාරි 01
භාෂා පරිවර්තක 01
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් 01
කළමනාකරණ සේවා නිලධාරි 24
සංවර්ධන සහකාර/ සංවර්ධන නිලධාරි 20
තොරතුරු තාක්ෂණ සහකාර 02
නිශ්චල ඡායාරූප ශිල්පී 01
වීඩියෝ කැමරා ශිල්පී 01
කාර්යාල කාර්ය සහායක 11
රියදුරු 11
කැමරා සහායක 01

1.5 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

❑ ආයතන හා පරිපාලන අංශය

- අමාත්‍යාංශයට අදාළ සියලුම පරිපාලන කටයුතු.
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසි ලෙස නඩත්තු කිරීම.
- මානව සම්පත් සංවර්ධනය.
- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සකස් කිරීම.
- පාර්ලිමේන්තු කාරක සභාවලට අදාළ ක්‍රියාකාරකම් එනම් මහජන පෙත්සම් කාරක සභාව, විදුලිබල හා බලශක්ති පිළිබඳ උපදේශක කාරක සභාව සහ පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව.
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ව්‍යවස්ථාපිත ආයතන සඳහා පරිපාලන මාර්ගෝපදේශ සැපයීම.

❑ සංවර්ධන අංශය

- පෙරභාග, මධ්‍ය සහ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළවන සංවර්ධන ප්‍රතිපත්තිමය තීරණ සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනයට අදාළ සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ඛනිජ තෙල් අංශයට අදාළ සංවර්ධන හා නියාමන කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.
- සියලුම සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම.
- ඛනිජ තෙල් සම්බන්ධ නිෂ්පාදන මිල නියම කිරීම, ඉන්ධන සහනාධාර ලබාදීම, වෙළඳාම සහ අලෙවිකරණයට අදාළ ගැටළු ආදියේදී මුදල් අමාත්‍යාංශය, හා අනෙකුත් රාජ්‍ය ආයතන සමබන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ නැව් තෙල් වෙළඳපොළ සහ ලිහිසි තෙල් වෙළඳපොළ සම්බන්ධ කටයුතුවල යෙදී සිටින සුදුසු පාර්ශ්ව වෙත බලපත්‍ර නිකුත් කිරීම/නිකුත් කරන ලද බලපත්‍ර අලුත් කිරීම සහ වෙනත් විශේෂිත වූ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට පෞද්ගලික අංශයට අවසර ලබාදීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්‍රියාකාරකම්.

❑ ප්‍රතිපත්ති, තාක්ෂණික සහ පර්යේෂණ අංශය

- විදුලිබල හා බලශක්ති ප්‍රතිපත්තිය සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි ආඥාපනත යටතේ විධිවිධාන සංශෝධනය කිරීම, රෙගුලාසි හා රීති පැනවීම, ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සිදු කිරීම, විදුලි ගාස්තු පැනවීම, බලපත්‍ර නිකුත් කිරීම ඇතුළුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම.
- ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන සංශෝධනය කිරීම සහ රෙගුලාසි බලාත්මක කිරීම, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම, විදුලි ගාස්තු කෙටුම්පත් කිරීම සහ බලපත්‍ර නිකුත් කිරීම යනාදී කටයුතුවලදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, සංවර්ධනය සහ බලශක්ති සංරක්ෂණය සහ ඉල්ලුම පැත්ත කළමනාකරණය සම්බන්ධ සියලුම තාක්ෂණික ක්‍රියාකාරකම් සහ විදුලිය බිඳවැටීම්, සම්ප්‍රේෂණයේ අඩුවීම් සහ බෙදාහැරීම් වැළැක්වීම සම්බන්ධ කරුණු.
- විදුලි බලාගාරයන්හි නිෂ්පාදන සහ මෙහෙයුම් කටයුතු නිරීක්ෂණය කිරීම.
- පරමාණුක බලශක්ති නියාමන සභාව (AERC) සහ පරමාණුක බලශක්ති මණ්ඩලය (AEB) විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- විදුලිබල පනතට අදාළ නීති රීති පැනවීම.
- බලශක්ති අංශයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා පහසුකම් සැලසීම.
- ලෝක බලශක්ති කවුන්සිලයට සම්බන්ධ කටයුතු.
- අමාත්‍යාංශය විෂය පථය යටතේ වන සියලුම

අවබෝධතා සහ සහයෝගිතා ගිවිසුම් සම්බන්ධීකරණය, අනුමැතිය සහ ක්‍රියාත්මක කිරීම.

❑ විදුලි උත්පාදන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අංශය

- විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කරුණු සහ විශාල හා මධ්‍ය පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වාදීමේ ක්‍රියාවලිය මෙහෙයවීම.
- තාප විදුලි බලාගාර ව්‍යාපෘති සහ පුනර්ජනනීය විදුලි බලාගාර ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු.
- ඉහත සඳහන් ව්‍යාපෘතිවලට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

❑ සැලසුම් අංශය

- අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ප්‍රගති වාර්තාව සකස් කිරීම.
- ව්‍යාපෘති යෝජනා සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
- සංවර්ධන ව්‍යාපෘති සඳහා වාර්ෂික අයවැය සකස් කිරීම.
- ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ වාර්තා සකස් කිරීම.
- විදුලිබල අංශයේ ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සහ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම්.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, රේඛීය අමාත්‍යාංශ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු මඟින් ඉල්ලා සිටින විවිධ වාර්තා සහ සැලසුම් සකස් කිරීම.

❑ ප්‍රසම්පාදන අංශය

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවලට අදාළ කටයුතු සිදුකිරීම.
- අමාත්‍යාංශය යටතේ වන ආයතන මඟින් සිදුකරනු ලබන ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ විවිධ ප්‍රසම්පාදන කමිටු පත්කිරීමට අදාළ කටයුතු.
- සමස්ත ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මඟින් ඉටුකරනු ලබන ප්‍රසම්පාදන කාර්යයන් අධීක්ෂණය, මෙහෙයවීම සහ අවශ්‍ය අවස්ථාවලදී මනා ප්‍රසම්පාදනයක් උදෙසා උපදෙස් ලබා දීම.
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු ප්‍රසම්පාදන කාර්යයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම.

❑ මූල්‍ය අංශය

- පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව අමාත්‍යාංශයේ සියළුම වියදම් සිදු කිරීම.
- ගරු අමාත්‍යතුමන්ලාගේ කාර්ය මණ්ඩලවල හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වැටුප් සකස් කිරීම, ගෙවීම හා වැටුප් සම්බන්ධ අනිකුත් කටයුතු සිදු කිරීම.
- ගරු අමාත්‍යතුමන්ලාගේ කාර්ය මණ්ඩලයට හා අමාත්‍යාංශයට අවශ්‍ය සියලුම වට්ටෝරු භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ විධිමත්ව ඇණවුම් කිරීම හා අංශවල අවශ්‍යතා අනුව ඒවා නිකුත් කිරීම
- අමාත්‍යාංශය සතු නිල බැංකු ගිණුම නිසි අයුරින් පවත්වාගෙන යාම.
- ඉදිරි මුදල් වර්ෂය සඳහා අමාත්‍යාංශයේ වියදම්වලට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයන් ගණනය කරමින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.
- රජයේ ආදායම් වශයෙන් අමාත්‍යාංශය වෙත ලැබෙන මුදල් හා අමාත්‍යාංශයේ කටයුතුවලදී දරණු ලබන වියදම් සඳහා සම්මත වර්ගීකරණය කිරීම හා ඒ සම්බන්ධ වාර්තා පවත්වා ගෙන යාම.

- අමාත්‍යාංශයට දෛනිකව ලැබෙන ආදායම් හා සිදු කරන වියදම් අනුව ඒ ඒ මාසවලට ගිණුම් පිළියෙල කිරීම හා එම ගිණුම්වල තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂිකව අමාත්‍යාංශයේ සියලුම ගණුදෙනු නියෝජනය වන පරිදි විසර්ජන ගිණුම පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.

❑ **අභ්‍යන්තර විගණන අංශය**

- විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- අමාත්‍යාංශ ලේකම්ගේ නියෝග අනුව විශේෂ පරීක්ෂණ හා විමර්ශණ සිදු කිරීම.
- අමාත්‍යාංශය යටතේ වන ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශවල කටයුතු සම්බන්ධීකරණය.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

ලංකා විදුලිබල මණ්ඩලය - වර්ෂ 1969 අංක 17 දරණ පනත මඟින් සංස්ථාපනය කර ඇත. විදුලිබලය ජනනය කිරීම, එය සම්ප්‍රේෂණය කිරීම හා සියළුම වර්ගයන්හි පාරිභෝගිකයන් සඳහා බෙදාහැරීම, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (PUCSL) මඟින් අනුමත කර ඇති මිල ගණන් අනුව ආදායම් එකතු කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලය පවරා ඇත.

සී/ස. ලංකා විදුලි පුද්. සමාගම (LECO) - 54.84% ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි මහා භාණ්ඩාගාරය වෙත 43.56% ක ද, නාගරික සංවර්ධන අධිකාරිය වෙත 0.79% ක ද, දේශීය අධිකාරීන් වෙත 0.81%ක සුළුතර කොටස් හිමිකාරීත්වයක් සහිතය.

සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ස් පුද්. සමාගම - 63%ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි සුළුතර කොටස් හිමිකාරීත්වය (37%) එහි සේවකයන් සතුය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) - 2007 අංක 35 පනත මඟින් පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ පිහිටුවන ලදී.

සී/ස. ලංකා ගල් අඟුරු පුද්. සමාගම - 60 % ක කොටස් හිමිකාරීත්වයක් සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ උපයෝගී සමාගමක් වන මෙහි මහා

භාණ්ඩාගාරය වෙත 20% ක, ශ්‍රී ලංකා නැව් සංස්ථාව වෙත 10 % ක හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත 10 % ක සුළුතර හිමිකාරීත්වයක් සහිතය.

සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම - ලංකා විදුලිබල මණ්ඩලයට 100% ක හිමිකාරීත්වය සහිතයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවා ඇත.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම - 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද සමාගමකි.

ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය - 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත යටතේ පිහිටුවන ලදී.

ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම - 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලදී.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වගුව 1.1
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ආධාර දෙන ආයතනය	ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි)	ව්‍යාපෘති කාලසීමාව	ප්‍රගතිය 2022	
					මූල්‍ය	භෞතික
ජනන ව්‍යාපෘති						
1	මෙ.වො 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදි කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	18,553	2018-2023	32%	45%
2	මෙ.වො. 35 බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය ඉදි කිරීම.	චීනය (මුලින්)	9,424	2013-2022	100%	100%
3	මෙ.වො. 120 උමා ඔය ජල විදුලි බලාගාරය.	ඉරානය	ඇ.ඩො.මි. 530	2010-2023	වාරිමාර්ග අමාත්‍යාංශය විසිනි	99%
විදුලි සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ව්‍යාපෘති						
4	නව පොල්පිටිය-හම්බන්තොට කි.වෝ. 220, කි.මී. 150 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම	ආසියානු සංවර්ධන බැංකුව	5,794	2018-2023	85%	95%
5	පාදුක්ක - හොරණ කි.මී. 25ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම.	ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	592	2020-2023	33%	43%

6	කොළඹ B ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම කොළඹ C - කොලොන්නාව ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 132 තනි ආදාන හා ප්‍රතිදාන සම්බන්ධතාව 800mm 2 රැහැන් කොළඹ C හා කොලොන්නාව ග්‍රිඩ් උපපොළ ආවර්ධනය (AFD)	ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	929	2019-2022	85%	97%
7	කොටුගොඩ, කොලොන්නාව, පාදුක්ක, හොරණ, දෙහිවල සහ මාදම්පේ ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම	ආසියානු සංවර්ධන බැංකුව	2,214	2018-2022	88%	99%
8	බියගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම බියගම ග්‍රිඩ් උපපොළ ආවර්ධනය	ආසියානු සංවර්ධන බැංකුව	1,540	2018-2022 2022 ජනවාරි මස අවසන් කර ඇත	89%	100%
9	අම්බලන්ගොඩ කි.වෝ. 132/33 ජාල උපපොළ වැඩි කිරීම, පන්නල කි.වෝ. 132/33 ජාල උපපොළ වැඩි කිරීම සහ කි.වෝ. 132/33 මෙ.වෝ.ඇම්. 31.5 ක අමතර ට්‍රාන්ස්ෆෝමර් 2ක් සැපයීම	ආසියානු සංවර්ධන බැංකුව	1,739	2022-2024	10%	16%
10	පන්නිපිටිය ග්‍රිඩ් උපපොළේ 100Mvar BSC ඉදි කිරීම බියගම ග්‍රිඩ් උපපොළේ +100/-50 MVAR SVC ඉදි කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	2,699	2019-2023	84%	71%
11	124Mvar බ්‍රේකර් ස්විච් කළ ධාරිත්‍රක බැංකු කොළඹ නගරයේ ග්‍රිඩ් උපපොළවල ස්ථාපනය කිරීම සහ තුල්හිරිය ග්‍රිඩ් උපපොළේ ඉවත් කරන ලද බ්‍රේකර් ස්විච් කරන ලද ධාරිත්‍රක බැංකු ප්‍රතිස්ථාපනය කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	1,763	2022-2023	10%	ආරම්භ කිරීමට නියමිතය
12	කෙරවලපිටිය කි.වෝ. 220 ස්විච්චිඵපන්න අංගනය ඉදි කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	2,910	2020-2023	25%	42%

13	කි.වෝ. 33 බෙදාහැරීම් කුළුණු මාර්ග හා ගැන්ට්‍රි (P4) - ඇතුල්කෝට්ටේ සහ බෙලිගහ කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ ආවර්ධනය - රත්තනපිටිය නව 2x10 MVA කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ ඉදි කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව හා ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	4,146 (P4: 2,736 P5: 1,440)	2019-2023	P4 (81%) P5 (72%)	P4 (100%) P5 (55%)
14	300 kVA ක්ෂුද්‍ර ජාල (Micro Grid) නියමු ව්‍යාපෘතිය - (ලංකා විදුලි (පුද්) සමාගම)	ආසියානු සංවර්ධන බැංකුව	277	2019 – 2022 (අවසන් කර ඇත)	100%	100%
15	විදුලි සැපයුමේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. කි.වෝ. 33 කුළුණු මාර්ග කි.මී 300ක් සහ කි.වෝ. 33 සම්බන්ධන ගැන්ට්‍රි 13ක් ඉදි කිරීම.	ආසියානු සංවර්ධන බැංකුව	6,782	2019 - 2022	36%	44%
16	හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය නව හබරණ ග්‍රිඩ් උපපොළේ සිට වේයන්ගොඩ ග්‍රිඩ් උපපොළ දක්වා කි.මී 146ක කි.වෝ. 220 ද්විත්ව පරිපථ තෙකලා, ද්විත්ව, අඩු හානි සන්නායක (2 x LL-TACSR) රැහැන් මාර්ගය ඉදි කිරීම.	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය (JICA)	10,757	2018 – 2022 (ද්විත්ව පරිපථ රැහැන් මාර්ගය 2021 මැයි මාසයේ දී අවසන් කර ඇත)	85%	99%
17	නව හබරණ කි.වෝ. 220/132/33 ස්විච්චිපන්න අංගන ස්ථානය ඉදි කිරීම.	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය (JICA)	4,190	2018-2022	100%	100%
18	ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1 පැකේජ 1 - සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම. පැකේජ 2 - ග්‍රිඩ් උපපොළ ඉදි කිරීම. පැකේජ 3 - සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම. පැකේජ 4 - බෙදාහැරීම් මාර්ග ඉදි කිරීම.	ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතය (JICA)	29,521 (P1:4780, P2:8826, P3:11,321, P4:4594)	2019 - 2023	P1 (22%) P2 (76%) P3 (72%) P4 (55%)	P1 (60%) P2 (68%) P3 (58%) P4 (41%)

විදුලිබල අංශය

2.1 විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාව

ජාතික විදුලිබල ජාලයේ ස්ථාපිත ධාරිතාවය මෙගාවොට් 4,809 ක් වන අතර එය 62% වන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් 38% ක් වන පොසිල ඉන්ධනවලින් සමන්විත වෙයි. පොසිල ඉන්ධනවලට අයත් කොටසින් 19% ක් සමන්විත වන්නේ ගල් අඟුරුවලින් වන අතර ඉතිරි 19% තාප ඉන්ධන තෙල් මඟින් සමන්විත වෙයි. ධාරිතා මිශ්‍රණයේ ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය ප්‍රධාන ජල විදුලිය වන අතර එය 30% කි. අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභාවනයන් වන සුළං, සූර්ය (භූමිය මත ස්ථාපිත හා සූර්ය පියැසි), කුඩා පරිමාණ ජල විදුලි, ජෛව ස්කන්ධ සහ නාගරික ඝන අපද්‍රව්‍ය ද විදුලිබලය ජනනය කිරීම සඳහා භාවිත කරනු ලබන අතර එය ධාරිතා මිශ්‍රණයෙන් 32% ක ප්‍රමාණයකි.

2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුළ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මඟින් මෙගාවොට් 259 ක ධාරිතාවයක් ජාතික විදුලිබල ජාලයට එකතු කොට ඇත. සූර්ය පියැසි පද්ධති 12,179 ක් මඟින් මෙගාවොට් 223 ක ධාරිතාවයක් ජාලයට එකතු කොට ඇත. භූමිය මත ඉදිකරනු ලබන සූර්ය බලාගාර 28ක් මඟින් මෙගාවොට් 32ක ධාරිතාවයක් ජාලයට එකතු කොට ඇත.

ප්‍රස්ථාරය 2.1
සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව 2022



මූලාශ්‍රය : ලං.වි.ම, සු.බ.අ

වගුව 2.1
ජාතික විදුලිබල ජාලයේ සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව (2023 - මාර්තු)

බලශක්ති ප්‍රභවය		ධාරිතාවය (මෙගාවොට්) (2023 - මාර්තු)	ධාරිතාවය (මෙගාවොට්) (2021 - දෙසැම්බර්)	ස්ථාපිත ධාරිතාව (2023 - මාර්තු) %	විදුලි බලාගාර සංඛ්‍යාව
තාප	ඉන්ධන තෙල් (ලංවීම)	654	604	14%	9
	තාප තෙල් (පුද්.වි.බල)	270	457	5%	1
	ගල් අඟුරු	900	900	19%	1
සම්පූර්ණ තාප විදුලිය		**1,824**	**1 961**	**38%**	**11**
පුනර්ජනනීය	ප්‍රධාන ජල	1,413	1,383	30%	18
අනෙකුත් පුනර්ජනනීය විදුලිය	කුඩාපරිමාණ ජල	429	429	9%	214
	සුළං	248	248	5%	18
	සූර්ය (භූමිය ස්ථාපිත)	132	96	3%	81
	ඩෙන්ඩ්‍රෝ හා ජෛව ස්කන්ධ	52.6	43.5	1%	14
	කසළ මඟින් විදුලිය	10	10	0.2%	1
	නාගරික ඝන අපද්‍රව්	700	439	14%	
අනෙකුත් පුනර්ජනනීය - එකතුව		**1,572**	**1,267.5**	**32%**	**328**
පුනර්ජනනීය විදුලිය - එකතුව		**2,985**	**2,650.5**	**62%**	**346**
සම්පූර්ණ ස්ථාපිත ධාරිතාව		**4,809**	**4,611.5**	**100%**	**357**

මූලාශ්‍රය : ලං.වි.ම, ලං.වි.ප්‍රැ.ස, සු.බ.අ

ප්‍රස්ථාරය 2.2
පුනර්ජනනීය බලශක්ති ධාරිතාව (මෙගා වොට්)



මූලාශ්‍රය : ලං.වි.ම, ලං.වි.ප්‍ර.ස, සු.බ.අ

ප්‍රස්ථාරය 2.3
අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ධාරිතා එකතු කිරීම් (මෙගා වොට්)



මූලාශ්‍රය : ලං.වි.ම, සු.බ.අ

පසුගිය වසර 5 ක කාලය තුළ නව විදුලි බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමත් සමඟ ජාතික ජාලයේ පුනර්ජනනීය බලශක්ති ධාරිතාවය වර්ධනය විය.

2.2 2022 - විදුලිබල ජනනය

2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ශුද්ධ විදුලි ජනනය ගිගාවොට් පැය 15,845 කි. 2022 වර්ෂයේ ජනනය කරනු ලැබූ සම්පූර්ණ විදුලියෙන් 48% ක් ජනනය කොට ඇත්තේ තාප විදුලි ප්‍රභවයන් මඟිනි. 2022 ජනන මිශ්‍රණයෙන් 52% ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් සමන්විත වෙයි. එම පුනර්ජනනීය බලශක්තියෙන් 34% ක් ප්‍රධාන ජල මූලාශ්‍රයන්ගෙන් හා 15% ක් වන අනෙකුත් පුනර්ජනනීය බලශක්ති (සුළං, සූර්ය (භූමිය මත)), කුඩා පරිමාණ ජල විදුලිය, ජෛව ස්කන්ධ හා 3% ක් වන සූර්ය පියසි මඟින් සමන්විත වෙයි. තාප විදුලියෙන් වැඩි ප්‍රමාණයක් ගල් අඟුරු භාවිතයෙන් ජනනය කොට ඇති අතර එය 33% කි. ඉන්ධන තෙල් මඟින් ඉතිරි 15% සමන්විත වෙයි. (ලං.වි.ම. සතු බලාගාර මඟින් 8% ක් සහ පුද්ගලික තාප බලාගාර මඟින් 7%ක් වශයෙන්).

ප්‍රස්ථාරය 2.4
විදුලිබල ජනන මිශ්‍රණය



මූලාශ්‍රය : ලං.වි.ම,

අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් උත්පාදනය කරනු ලබන විදුලි ප්‍රමාණය පසුගිය වසර 5 ක කාලය තුළ වර්ධනය වීමක් පෙන්නුම් කර ඇත. සූර්ය බල සංග්‍රාමය වැඩසටහන මෙරටට හඳුන්වා දීමත් සමඟම අනෙකුත් පුනර්ජනනීය බලශක්ති මිශ්‍රණයන්හි ඇති සූර්ය පියැසි මඟින් ජනනය කරනු ලබන විදුලි ප්‍රමාණයන්හි වර්ධනයක් පෙන්නුම් කරනු ලබයි.

ප්‍රස්ථාරය 2.5
අනෙකුත් පුනර්ජනනීය බලශක්ති මඟින් විදුලි ජනනය (ගි.වොට.පැ.)



මූලාශ්‍රය : ලං.වි.ම

ප්‍රස්ථාරය 2.6
සූර්ය පියසි මඟින් විදුලි ජනනය (ගි.වොෑ.පැ.)



මූලාශ්‍රය : ලංවි.ම

2.3 විදුලි ඉල්ලුම සහ පාරිභෝගික වර්ධනය

2022 වර්ෂයේදී විදුලි ඉල්ලුම පෙර වර්ෂවලට වඩා 0.1% කින් පහළ වැටීමක් පෙන්නුම් කරයි. 2021 වර්ෂයේදී වාර්තා වූ මෙගාවොට් 2,802 කට සාපේක්ෂව 2022 වර්ෂයේදී වාර්තා වූ ඉහළ විදුලි ඉල්ලුම මෙගාවොට් 2,709 කි. වාර්තා වූ සාමාන්‍ය දෛනික විදුලි ඉල්ලුම 2022 වර්ෂයේදී ගි.වොෑ.පැ. 40 ක පමණ අගයක් ගෙන ඇත.

2022 වර්ෂයේ සිටි විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව 7,547,472 කි.

වගුව 2.2
විදුලි පාරිභෝගිකයන්
(2022 වසරේ දෙසැම්බර් වන විට)

අයකුම කාණ්ඩය	පාරිභෝගිකයන් සංඛ්‍යාව 2022	පාරිභෝගිකයන් සංඛ්‍යාව 2021
ගෘහස්ථ	6,471,242	6,271,727
ආගමික	45,875	44,543
කර්මාන්ත	72,221	69,069
පොදු අවශ්‍යතා	941,303	899,193
හෝටල්	642	665
රාජ්‍ය	9,741	9,385
කෘෂිකාර්මික	2,733	1,477
වීදි ආලෝකකරණය	3,715	3,574
එකතුව	**7,547,472**	**7,299,633**

මූලාශ්‍රය: ලංවි.ම, ලංවි.පු.ස.

ප්‍රස්ථාරය 2.7
විදුලි පාරිභෝගිකයින්
(2022 වසරේ දෙසැම්බර් වන විට)



මූලාශ්‍රය: ලංවි.ම, ලංවි.පු.ස.

2.4 විදුලි ජනනය ඉහළ නැංවීම

වාර්ෂිකව ඉහළ යන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා අමාත්‍යාංශය ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන සැලසුම්වලට අනුව හා රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව විදුලි ජනන ව්‍යාපෘති සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලබයි. අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පහත විස්තර කරනු ලබන විදුලි ජනන ව්‍යාපෘති 2022 වර්ෂයේදී විවිධ ඉදිකිරීම් අදියරයන්හි ක්‍රියාත්මක විය.

2.4.1 පුනර්ජනනීය විදුලිබල ජනනය

- **ප්‍රධාන ජල විදුලි**

(අ) බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය - මෙගාවොට් 35

මෙම විදුලි බලාගාරය මඟින් විදුලිය ජනනය කිරීම 2022 ජනවාරි මස අවසානයේ සිට ආරම්භ කරන ලදී. සමාලෝචිත වර්ෂයේදී මෙම බලාගාරය විසින් ගිගාවොට් පැය 98 ක බලශක්තියක් ජනනය කොට ඇත. පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (Clean Development Mechanism (CDM)) යටතේ ලියාපදිංචිය ලබාගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ ජලවිදුලි ව්‍යාපෘතිය මෙයයි. මෙම බලාගාර විසින් අපේක්ෂිත වාර්ෂික විදුලි ජනනය ගිගාවොට් පැය 126 කි. ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො මිලියන 82 ක පිරිවැයක් දරා ඇත.

(ආ) උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය - මෙගාවොට් 120

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වන්නේ, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල හෙක්ටයාර 5,000 ක පමණ වන ඉඩම්වල කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සැන මීටර් 145 ක් හරවා යැවීමත්, වර්ෂිකව ගිගාවොට් පැය 290 ක විදුලියක් ජනනය කිරීමත්ය. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 530 කි. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු 99% ක් නිම කොට ඇති අතර 2023 ජූනි මස 24 දින වන විට බලාගාරය බලගැන්වීමට අපේක්ෂිතය. කෙසේ නමුත් විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ඇති වූ විදේශ විනිමය හිඟය නිසා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය විදේශ විනිමය නොලැබීමෙන් බලගැන්වීම් කටයුතු කල් යෑමට බලපෑවේය.

(ඇ) මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය - මෙගාවොට්

මහවැලි නදී නිම්නයේ ඉදිකරනු ලබන අවසන් ජල විදුලි ව්‍යාපෘතිය වන්නේ මොරගොල්ල බලාගාරයයි. ව්‍යාපෘති වැඩබිම මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ආශ්‍රිතව පිහිටා ඇත. අපේක්ෂිත වාර්ෂික විදුලි ජනනය ගිගා වොට් පැය 100 කි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩොලර් මිලියන 114 ක් වන අතර මුල්‍යාධාර ආසියානු සංවර්ධන බැංකුව මඟින් ණය පහසුකමක් ලෙස ලබා දී ඇත. මේ වනවිට ව්‍යාපෘති ඉදිකිරීම් වලින් 45% ක් නිම කොට ඇත. 2024 මැයි මස 23 වන දින වන විට ව්‍යාපෘතිය බලගැන්වීමට අපේක්ෂා කරනු ලැබේ.

ප්‍රධාන උමගෙහි ඉදිකිරීම

මූලාශ්‍රය: ලං.වි.ම, ලං.වි.පු.ස.

බලාගාරය

මූලාශ්‍රය: ලං.වි.ම, ලං.වි.පු.ස.

- **අනෙකුත් පුනර්ජනනීය බලශක්ති**

i. සූර්ය බලය

(අ) සූර්ය පියැසි වැඩසටහන - සූර්ය බල සංග්‍රාමය

මෙරට ජනතාව පුනර්ජනනීය බලශක්තිය පදනම් කර ගත් විදුලි ජනනයට සම්බන්ධ කර ගැනීම සඳහා අඩු පොළී ණය පහසුකමක් මත 2016 වර්ෂයේදී සූර්ය බල සංග්‍රාමය වැඩසටහන ආරම්භ කරන ලදී. 2019 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව විසින් ගෘහස්ථ හා වාණිජ ආයතන මත කිලෝ වෝල්ට් 5 ක සූර්ය පියැසි පද්ධති ස්ථාපිත කිරීමට මෙම වැඩසටහන සඳහා ඇ.ඩො. මිලියන 50ක ණය මුදලක් ලබා දුන් අතර එම ණය මුදල 2021 වර්ෂයේදී සම්පූර්ණයෙන් උපයෝජනය කොට මෙගාවොට් 71 ක ධාරිතාවයක් සූර්ය පියැසි හරහා ජාතික පද්ධතියට සම්බන්ධ කරන ලදී. අමාත්‍යාංශය මඟින් මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට ආසියානු සංවර්ධන බැංකුවෙන් තවත් ඇ.ඩො මිලියන 80 ක ණය මුදලක් ඉල්ලුම් කර ඇති අතර එය සලකා බලමින් පවතියි. මේ වනවිට (2023 මාර්තු) මෙගාවොට් 700 ක පමණ ධාරිතාවයක් සූර්ය පියැසි පද්ධති 47,604 ක් හරහා ජාතික විදුලි ජාලයට එකතුකොට ඇත. සූර්ය පියැසි සම්බන්ධ කරනු ලබන යෝජනා ක්‍රම තුන යටතේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට ප්‍රගතිය පහත පරිදි වෙයි.

වගුව 2.3
2022 දෙසැම්බර් වන විට සූර්ය පියැසි වැඩසටහන්හි ප්‍රගතිය

යෝජනා ක්‍රම	පාරිභෝගිකයන්	ධාරිතාවය (කි.වො.)
ශුද්ධ මනුකරණය	14,246	107,895
ශුද්ධ ගිණුම්කරණ	28,421	248,421
නෙට් ප්ලස් ක්‍රමය	3,118	305,542
එකතුව	**45,785**	**662,339**

මූලාශ්‍රය: ලං.වි.ම, ලං.වි.පු.ස.

(ආ) භූමිය මත ඉදිකරනු ලබන කුඩා පරිමාණ සූර්ය බලාගාර (මෙගාවොට් 68x1)

මෙම ව්‍යාපෘතිය යටතේ මෙගාවොට් 36 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලයට එකතු කොට ඇති අතර තවත් විදුලි බලාගාර 32 ක් ඉදිකිරීම් මට්ටමේ පවතියි. 2023 වර්ෂය අවසාන වනවිට එම ඉදිකිරීම් නිමකොට බලගැන්වීමට අපේක්ෂා කෙරෙයි.

(ඇ) වාලච්චේන හා වච්නතිව් - (මෙගාවොට් 10x2) සූර්ය බලාගාර

මෙගාවොට් 10 ක ධාරිතාවයෙන් යුත් වච්නතිව් සූර්ය බලාගාරය 2022 වර්ෂයේ ඔක්තෝබර් 11 දින බලගන්වන ලදී. මෙගාවොට් 10 වාලච්චේන සූර්ය බලාගාරය ඉදිකිරීම් අදියරේ පවතියි.

(ඈ) මෙගාවොට් 1-10 දක්වා වූ සූර්ය බලාගාර (මුළු ධාරිතාවය මෙගාවොට් 147)

පෞද්ගලික ආයෝජන මත සංවර්ධනය කිරීම සඳහා මෙගාවොට් 1-10 දක්වා වූ සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘති 147 ක් තෝරාගත් අතර ධාරිතාවය මෙගාවොට් 109 ක වූ බලාගාර සඳහා ටෙන්ඩර් ප්‍රධානය 2021 මාර්තු 02 සිදු කරන ලදී. මෙගාවොට් 88 ක බලාගාර සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් තාවකාලික අනුමැතිය නිකුත් කොට ඇත. දැනට මෙම ව්‍යාපෘතිවල ඉදිකිරීම් ක්‍රියාත්මක අතර 2023 සහ 2024 දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

(ඉ) සියඹලාණ්ඩුව සූර්ය බල උද්‍යානය - මෙගාවොට් 100

ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා සුදුසු සංවර්ධකයෙකු තෝරා ගැනීමට අභිප්‍රාය ලිපි 2022 අගෝස්තු මස කැඳවන ලදී. එහි මූල්‍ය විශ්ලේෂණය නිමකොට සාකච්ඡා සම්මුති පැවැත්වෙයි. මෙම උද්‍යානය නිම කිරීමෙන් පසු නිපදවන විදුලිය ලබාගෙන සම්ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍යවන අම්පාර-මැදගම සම්ප්‍රේෂණ මාර්ගයේ වැඩිදියුණු කිරීම් මේ වන විට ක්‍රියාත්මකයි.

ඉහත සඳහන් සූර්ය බල ව්‍යාපෘතිවලට අමතරව මෙගාවොට් 10 ක ධාරිතාවයෙන් යුත් මහියංගණය සූර්ය බල ව්‍යාපෘතිය ඉදිකිරීම් අදියරේ පවතියි.

(ඊ) ඉන්දියානු ණය පහසුකම් (ඇ.ඩො මිලියන 100) යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සූර්ය බල ව්‍යාපෘති

ඇ.ඩො මිලියන 100 ක ඉන්දියානු ණය ආධාර වැඩසටහන යටතේ පහත සඳහන් සූර්ය බල ව්‍යාපෘති මෙරට තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- රාජ්‍ය ආයතනවල සූර්ය පියැසි වැඩසටහන (ඇ.ඩො මිලියන 85)
- ආගමික ස්ථානවල සූර්ය පියැසි ඉදිකිරීම සහ ප්‍රති ආස්‍රැති (Reverse Osmosis) ඒකක ඉදිකිරීම. (ඇ.ඩො මිලියන 10)
- පාවෙන සූර්ය බලාගාර ව්‍යාපෘති ඉදිකිරීම (ඇ.ඩො මිලියන 5)

ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ජාතික විදුලි ජාලයට මෙගාවොට් 120 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයක් එකතු කිරීමයි. ව්‍යාපෘති කාලසීමාව 2022 දෙසැම්බර් සිට 2025 දෙසැම්බර් දක්වා අවුරුදු 03 කි. ව්‍යාපෘතිය අදියර 03 කින් ක්‍රියාත්මක වෙයි. සවිස්තර ව්‍යාපෘති වාර්තාව පිළියෙළ කිරීම, ව්‍යාපෘති කළමනාකරණ උපදේශකත්වය සහ ඉංජිනේරු, ඉදිකිරීම් හා ප්‍රසම්පාදන (EPC) කොන්ත්‍රාත්තුව. මෙහි සවිස්තර ව්‍යාපෘති වාර්තාව පිළියෙළ කිරීමේ කොන්ත්‍රාත්තුව ඉන්දියාවේ ~Darashaw~ සමාගම වෙත 2022.11.16 දින ප්‍රදානය කොට ඇති අතර

කොන්ත්‍රාත් අගය ඇ.ඩො. 930,209.487 කි. සූර්ය පියැසි ස්ථාපිත කිරීමට අවශ්‍ය ස්ථාන මේ වන විට හඳුනාගෙන ඇත.

(උ) ඉන්දියානු ණය ආධාර (ඇ.ඩො.මිලියන 10) යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සූර්ය පියැසි වැඩසටහන

ජාතික විදුලි ජාලයට සම්බන්ධ විය නොහැකි ඉතා දුෂ්කර ප්‍රදේශවල පිහිටි ආගමික ස්ථාන විදුලියනය කිරීම සඳහා මෙම වැඩසටහන ආරම්භ කර ඇති අතර බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. ඉන්දියානු එක්සිම් බැංකුව මඟින් ණය ආධාර ලබා දෙන අතර ව්‍යාපෘති කාලසීමාව 2022 සිට 2025 දක්වා වසර 03 කි.

(ඌ) උතුරු පළාතේ දුපත් තුනක දෙමුහුන් පුනර්ජනනීය විදුලි පද්ධති ස්ථාපිත කිරීම.

යාපනය අර්ධද්වීපයේ කුඩා දුපත් තුනක් වන ඩෙල්ෆ්ට්, අනලතිව් හා නයිනතිව් දුපත් විදුලියනය කිරීම සඳහා දෙමුහුන් පුනර්ජනනීය විදුලි පද්ධති ඉදිකිරීමට අදාළ අවබෝධතා ගිවිසුමක් ඉන්දියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර 2022.03.28 දින අත්සන් කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 11 ක් වන අතර 75% ක් ණය හා 25% ක් ප්‍රධාන ලෙස ඉන්දියානු එක්සිම් බැංකුව විසින් ලබා දෙනු ඇත. ව්‍යාපෘති කාලසීමාව 2023 සිට 2024 දක්වා එක් අවුරුද්දකි.

ii. සුළං බලය

පහත දැක්වෙන ප්‍රධාන සුළං විදුලිබල උද්‍යාන ව්‍යාපෘති ස්ථාපිත කිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා අවශ්‍ය මූලික වැඩ කටයුතු ආරම්භ කොට ඇත.

(අ) මන්නාරම සුළං බල ව්‍යාපෘතිය - අදියර 1 - දිගුව

මන්නාරම මෙගාවොට් 103 තම්බපන්නි සුළං බල උද්‍යානයේ දිගුවක් ලෙස තවත් මෙගාවොට් 50 ක සුළං බල උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කොට ඇත. මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 69 කි. මෙහි පාරිසරික බලපෑම් අධ්‍යයනය 2022 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. ඉඩම් අත්පත් කර ගැනීම (හෙක්ටයාර 65) දැනට ක්‍රියාත්මකව පවතියි. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව මඟින් එකඟ වූ ඇ.ඩො.මිලියන 40 පවතින ආර්ථික වාතාවරණය යටතේ නැවත සලකා බැලීමට (Repurpose) යොමුකොට ඇත.

(ආ) මන්නාරම සුළං බල උද්‍යානය (මෙගාවොට් 286)

මෙම සුළං බල උද්‍යානය පෞද්ගලික ආයෝජන මත ඉදිකිරීම සඳහා ඉන්දියාවේ අදානි ග්‍රීන් එනර්ජි සමාගම වෙත තාවකාලික අනුමැතිය නිකුත් කොට ඇත.

(ඇ) පුනරින් සුළං බල උද්‍යානය (මෙගාවොට් 234)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අදානි ග්‍රීන් එනර්ජි සමාගමට මෙගාවොට් 234 සහිත මෙම උද්‍යානය සංවර්ධනය කිරීමට අදාළ තාවකාලික අනුමැතිය නිකුත් කොට ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කොට ඇත. 2022 ඔක්තෝම්බර් මස මෙහි පළමු අදියරේ මෙගාවොට් 100 ක් සඳහා මූලික පාරිසරික විශ්ලේෂණය සම්පූර්ණ කරන ලදී. ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයන් මඟින් මූල්‍යාධාර ලබා දෙන ලදී.

(ඈ) ඉහත සඳහන් කරන ලද ප්‍රධාන සුළං බල උද්‍යාන ව්‍යාපෘතීන්ට අමතරව පහත සඳහන් සම්පූර්ණ ධාරිතාවය මෙගාවොට් 60 (මෙගාවොට් 1-10) වන කුඩා පරිමාණ සුළං බලාගාර ව්‍යාපෘති මන්නාරම (මෙගාවොට් 10 සහ මෙගාවොට් 5), මාදම්පේ (මෙගාවොට් 5x2) සහ තිකුණාමලය (මෙගාවොට් 10) බැඟින් පෞද්ගලික ආයෝජන මත ඉදිකිරීම් ටෙන්ඩර් ප්‍රදානය කොට ඇත. මෙම ව්‍යාපෘති ඉදිකිරීම් අදියරේ පවතින අතර 2023 වර්ෂාවසානය වන විට නිම කිරීමට අපේක්ෂිතයි.

2.4.2 තාප විදුලි ජනනය - ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) සංවර්ධනය

(අ) සොබාදනවී, කෙරවළපිටිය - මෙගාවොට් 350 පළමු LNG බලාගාරය

මෙම බලාගාරය මේ වනවිට ඉදිකිරීම් අදියරේ පවතියි. 2023 ජනවාරි මාසයේදී බලාගාරයේ වායුතල බවරණය හා විදුලි ජනකය ස්ථාපනය කරන ලදී. මෙහි සම්පූර්ණ භෞතික ප්‍රගතිය 2022 වර්ෂාවසානය වනවිට 22% කි. බලාගාරයේ විවෘත චක්‍රීය මෙහෙයුම් කටයුතු 2023 වර්ෂය අවසාන වන විට ආරම්භ කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරෙයි.

(අා) **LNG සඳහා යටිතල පහසුකම් සංවර්ධනය**

මෙම ව්‍යාපෘතිය අදියර තුනකින් සමන්විත වෙයි.

i. පාවෙන ගබඩා සහිත ප්‍රතිවායුකරණ ඒකකය (FSRU) සහ නෞකාංගන පද්ධතිය කෙරවළපිටිය වෙරළට ඔබ්බෙන් ස්ථාපිත කිරීම. (ලං.වි.ම. මඟින්)
ii. FSRU සිට LNG බලාගාරය දක්වා වායුතල පද්ධතිය ස්ථාපිත කිරීම. (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින්)
iii. FSRU සඳහා අවශ්‍යවන LNG සම්පාදනය කර ගැනීම. (ලං.වි.ම. මඟින්)

ඉහත ව්‍යාපෘති සංවර්ධනය සඳහා 2023 වර්ෂයේදී සුදුසු සංවර්ධකයෙකු තෝරා ගැනීමට අපේක්ෂා කෙරෙයි.

2.5 විදුලිබල සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම් සංවර්ධනය

- මෙරට විදුලි සම්ප්‍රේෂණ ජාලය කිලෝමීටර් 799 දිග කිලෝවෝල්ට් 220 ක රැහැන් වර්ග සහ කිලෝමීටර් 2,361 ක් දිග කිලෝවෝල්ට් 132 ක සම්ප්‍රේෂණ රැහැන්වලින් සමන්විත වන අතර එයට විදුලි ජාල උපපොළවල් 134 ක් සම්බන්ධ වෙයි. ලං.වි.ම විසින් සම්ප්‍රේෂණ ජාලයේ සම්පූර්ණ මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. විදුලි බෙදාහැරීම් ජාලය කිලෝ මීටර 33,138.27 දිග කිලෝ වෝල්ට් 33 රැහැන් සහ කිලෝමීටර් 2,448 දිග කිලෝ වෝල්ට් 11 සහ කිලෝමීටර් 150,169 දිග අඩු සැර විදුලි බෙදාහැරීම් රැහැන් සමන්විත වන අතර එයට බෙදාහැරීම් ජාල උපපොළ 33,476 ක් සම්බන්ධවෙයි.

- 2022 වර්ෂයේදී පහත දැක්වෙන සම්ප්‍රේෂණ මාර්ග සහ ජාල උපපොළවල් ඉදිකිරීම සම්පූර්ණ කරන ලදී.

i. නව හබරණ සිට වාලච්චේන දක්වා කිලෝ මීටර 100 දිග කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය
ii. නව හබරණ සිට පොළොන්නරුව දක්වා කිලෝ මීටර 44 දිග කිලෝ වෝල්ට් 132 සම්ප්‍රේෂණ මාර්ගය
iii. හබරණ සිට නව හබරණ දක්වා කිලෝ මීටර 3 දිග කිලෝ වෝල්ට් 132 රැහැන් ඉදිකිරීම
iv. මාදම්පේ, දෙහිවල, බියගම ජාල උපපොළවල් ආවර්ධනය කිරීම.

- පරිච්ඡේද 1 හි අනු ඡේද 1.7 මඟින් විස්තර කර පෙන්වා ඇති සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් විදුලි ව්‍යාපෘති 2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

- **සුහුරු ජාල නියමු ව්‍යාපෘතිය**

පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් ජනනය කරනු ලබන විදුලිය වැඩි වශයෙන් ඉතා කාර්යක්ෂමව විදුලි ජාලය තුළට අවශෝෂණය කර ගැනීම සඳහා බැටරි ගබඩා පහසුකම්වලින් යුත් කුඩා පරිමාණ සුහුරු ජාල ව්‍යාපෘතියක් නියමු ව්‍යාපෘතියක් ලෙස ලංකා විදුලි පුද්ගලික සමාගම මඟින් 2022 සැප්තැම්බර් මාසයේදී බලගන්වන ලදී. ව්‍යාපෘතියේ පිරිවැය ඇ.ඩො. මිලියන 26ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානයන් ලෙස අරමුදල් සම්පාදනය කරන ලදී.

2.6 දේශගුණික විපර්යාස අවම කිරීම සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාකාරකම්

2.6.1 විදුලිබල ක්ෂේත්‍රයේ ජාතිකව තීරණය කරන ලද දායකත්ව (NDCs)

විදුලිබල ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ NDCs සැලැස්ම සකස්කොට නිම කරන ලදී. ජාතික මෙහෙයුම් කමිටුව වෙත විදුලිබල ක්ෂේත්‍රයේ NDCs ප්‍රගතිය පිළිබඳව වාර්තා කරන ලදී. 2022 වර්ෂයේදී ප්‍රථම සැලසුම් හා අධීක්ෂණ කමිටු රැස්වීම සාර්ථකව පවත්වන ලදී. සාමාන්‍ය තත්ත්වයට සාපේක්ෂව විදුලිබල ක්ෂේත්‍රයේ හරිතාගාර වායු විමෝචනයන් අඩු කිරීම 25%ක් වෙයි. (කොන්දේසි විරහිතව 5%ක් සහ කොන්දේසි සහිතව 20%). වර්ෂ 2021-2030 කාල සීමාව තුළ ඇස්තමේන්තුගත හරිතාගාර

විමෝචනය අඩු කිරීම, කොන්දේසි විරහිතව මෙට්‍රික් ටොන් 9,819,000 වන අතර කොන්දේසි සහිතව මෙට්‍රික් ටොන් 39,274,000 කි. (සම්පූර්ණ විමෝචනය අඩු කිරීම මෙට්‍රික් ටොන් 49,093,000 කි.)

2.6.2 විදුලිබල ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු (SDG)

SDG ඉලක්ක 7 - සෑමට දැරිය හැකි විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සඳහා ප්‍රවේශය සහතික කිරීම

බලශක්ති සැපයුම් සහ අදාළ පරිවර්තන පද්ධතිවලට ප්‍රවේශයක් නොමැතිවීම මානව හා ආර්ථික සංවර්ධනයට බාධාවකි. පරිසරය මඟින් පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන බලශක්ති සම්පත් මාලාවක් සපයනු ලබයි. ඒවා නම් සුළං, සූර්ය, ජල, තාපය, ජෛව ඉන්ධන, ස්වභාවික වායු, ගල් අඟුරු හා ඛනිජතෙල්.

හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට පියවර නොගෙන පොසිල ඉන්ධන භාවිතය ඉහළයාම ගෝලීය දේශගුණික විපර්යාස බලපෑම් ඉහළ නැංවීමට හේතුවක් වෙයි. බලශක්ති කාර්යක්ෂමතාව හා පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීම, දේශගුණික විපර්යාස අවම කිරීමටත් ආපදා අවදානම අවම කිරීමටත් දායක වෙයි. ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා විදුලිබල අංශය දායක වී ඇත.

- විදුලි බෙදාහැරීම් ජාලය වැඩි දියුණු කිරීම මඟින් නිවාස 99.9% විදුලියනය කිරීම සහ ගුණාත්මක විදුලිය බෙදාහැරීමක් සහතික කිරීම.
- මෙරට විදුලිය සඳහා ප්‍රවේශ වීම 100% දක්වා ඉහළ නැංවීම
- මෙරට ජනන මිශ්‍රණයෙන් 52% ක කොටසක් පුනර්ජනනීය බලශක්ති මඟින් සම්පාදනය කිරීම.
- වර්ෂ 2022 දී සූර්ය පියසි මඟින් මෙගාවොට් 662 ක ධාරිතාවයක් ජාතික ජාලයට එකතු කිරීම.
- 2022 වර්ෂයේ කාර්යක්ෂමව බලශක්ති භාවිතය වැඩසටහන මඟින් ගිගා වොට් පැය 737 ක බලශක්තියක් ඉතිරි කිරීම.

2.7 පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

ඇමරිකා එක්සත් ජනපද ආධාර (USAID) වැඩසටහන යටතේ ලං.වි.ම. වෙත ඇ.ඩො. මිලියන 4.23, ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත ඇ.ඩො. මිලියන 1.9 හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ඇ.ඩො. මිලියන 3.6 ක මුල්‍යාධාර ප්‍රධානයන් මඟින් තාක්ෂණික සහාය ලබා දීමට ඉදිරිපත් වී ඇති අතර මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන ලෙස හැඳින්වේ. තෝරාගත් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා මෙමඟින් තාක්ෂණික සහාය සැපයෙන අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම 2022 වර්ෂයේදී පවත්වන ලදී.

2.8 2022 වර්ෂයේ අයවැය යෝජනා

2022 පරිපුරක ඇස්තමේන්තුව යටතේ රුපියල් මිලියන 80 ක ප්‍රතිපාදන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට ලබා දී ඇති අතර එමඟින් වෙරාවිල්, කරච්චි, මාන්තායි බටහිර සහ තුනුක්කායි ප්‍රදේශවල යෝජිත පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ප්‍රදේශවල ඩ්‍රෝන සමීක්ෂණයන් සිදු කිරීමට රුපියල් මිලියන 36.5 ක් වැය කරන ලදී.

බලශක්ති අංශය

2022 වර්ෂයේ ඉටුකරන ලද කාර්යයන්හි කාර්ය සාධනය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ වන බලශක්ති අංශය විසින් 2022 වර්ෂය තුළදී පහත ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටු කරන ලදී.

- ඛනිජ තෙල් කර්මාන්තය ලිහිල්කරණය සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- ඛනිජ තෙල් කර්මාන්තය නංවාලීම පිණිස විදේශ ආයෝජකයන් රටතුළට ගෙන්වා ගැනීම සඳහා පියවර ගැනීම.
- ඛනිජ තෙල් පිරිවැය ආවරණය කර ගැනීම සඳහා ඉන්ධන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

- ජාතික ඉන්ධන අවසරපත් ක්‍රමය හඳුන්වාදීම.
- විදේශ සංචාරකයන් සඳහා විශේෂ ඉන්ධන අවසරපතක් හඳුන්වාදීම.
- ඉන්ධන ප්‍රසම්පාදනය සඳහා විකල්ප ක්‍රම හඳුන්වාදීම.
- විශේෂයෙන් හඳුනාගත් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, ප්‍රවාහන සහ ධීවර යන ක්ෂේත්‍ර සඳහා ඉන්ධන සැපයීමට ප්‍රමුඛත්වය දීම.

2.9 2022 වසර තුළ රට තුළ පැවති ඉන්ධන අර්බුදය විසඳීම සඳහා ගෙන ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

විදේශ විනිමය සංචිත කඩාවැටීම සහ රට තුළ පැවති දැඩි උද්ධමන තත්ත්වයන් හේතුවෙන් රට, ඉන්ධන අර්බුදයකට මුහුණ දෙන ලදී. විදේශ සංචිත හිඟය හේතුවෙන් ඇති වූ බලශක්ති අර්බුදය මඟහරවා ගැනීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය 2022 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය.

i. විවිධ ගෙවීම් කොන්දේසි යටතේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට විකල්ප ක්‍රම හඳුන්වා දී ඇත.

- අනේවාසික රුපියල් (NRR ESCROW) ගිණුම් ක්‍රමය හරහා ගෙවීම.
  මෙම ගෙවීම් ක්‍රමයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇප සහතික වීමකට යටත්ව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දේශීය මුදලින් ගෙවීම් කරන අතර, දෙන ලද නිශ්චිත ණය කාල සීමාවකට පසුව ඇමරිකන් ඩොලර්වලින් ආපසු ගෙවීමට හැකියාව ලැබේ.

- ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර ගබඩාගත ටැංකිවලින් නිකුත්කිරීමේදී ගෙවීම් ක්‍රමවේදය (Ex-storage Modality).
  මෙම ක්‍රමය මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ගබඩා පර්යන්තය වෙත ඉන්ධන මුදා හරින අතර, නැවත ගබඩාවෙන් මුදාහරිනු ලබන ප්‍රමාණය සඳහා කොටස් වශයෙන් ගෙවීම සිදු කරනු ලබයි. මෙම විධිවිධානය මගින් අඛණ්ඩ ඉන්ධන සැපයුම සහතික කිරීමට හැකි වන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුදල් ප්‍රවාහයට ඇති කරන පීඩනය ලිහිල් කරනු ලැබේ.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත කිසිදු ආනයන වියදමකින් තොරව ගුවන් යානා (Jet A-1) ඉන්ධන ආනයනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවශ්‍යතාවයට අනුව සැපයුම්කරුවන්ට ගුවන් යානා (Jet A-1) ඉන්ධන ඔවුන්ගේ වියදමින් ආනයනය සඳහා අවසර දී ඇති අතර ඉන්ධන අලෙවිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ගුවන් සේවා කාර්යංශය මගින් සපයනු ලබන විකුණුම් ප්‍රමාණය අනුව සතිපතා ගෙවීම සිදු කරනු ලැබේ.

- තවත් කාලීන උත්සාහයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පාවෙන ගබඩා මගින් ඉන්ධන මිලදී ගැනීමේ ක්‍රමය හඳුන්වා දුන් අතර මෙමගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හට ඉන්ධන ගොඩබෑමේ අවස්ථා 2-3 ක් දක්වා නිශ්චිත කාල සීමාවක් තුළ ටැංකියෙන් භාණ්ඩ ලබා ගැනීමට හැකි වේ. ටැංකි වලින් භාණ්ඩ ලබා ගන්නා අවස්ථාවේදී ගෙවීම් කරනු ලැබේ.

- ලියාපදිංචි ඉන්ධන සැපයුම්කරුවන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන සඳහා සහභාගීත්වය අඩු වී ඇති බැවින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉන්ධන සැපයීමට උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වයන්ට ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

- ඉන්දියානු ණය ආධාර වැඩසටහන යටතේ ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම

  ඉන්දියානු රාජ්‍ය බැංකුවෙන් ලබාගත් ඩොලර් මිලියන 1000 ක ණය පහසුකමින් ඉන්ධන ආනයනය සඳහා ඩොලර් මිලියන 200 ක් සහ ඉන්දීය ආනයන අපනයන බැංකුව මඟින් ඩොලර් මිලියන 500 ක කෙටි කාලීන ණය පහසුකමක් ලබා දීමට ඉන්දීය රජය ශ්‍රී ලංකා රජය සහ ලංකා ඛනිජ තෙල්

නීතිගත සංස්ථාව සමඟ ණය ගිවිසුමකට එලඹියේය. ඒ අනුව ඉන්ධන ආනයනය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 700 ක සමස්ත ණය පහසුකමක් ඉන්දියාව විසින් ලබා දෙන ලදී. මෙම ණය පහසුකම මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන නැව් 17ක් ආනයනය කළ අතර, 2.4 වගුව මගින් ඒ පිළිබඳ විස්තර දක්වා ඇත.

වගුව 2.4
ඉන්දීය ණය ආධාර යටතේ ආනයනය කරන ලද ඉන්ධන තොග ප්‍රමාණයන්

අනු අංකය	නිෂ්පාදනයේ නම	නැව් තොග ගණන	ප්‍රමාණය (මෙ.ටො.)
1	ඔටෝ ඩීසල්	8	301,440
2	සුපර් ඩීසල්	2	77,682
3	පෙට්‍රල් 92	6	221,053
4	ජෙට් ඒ -1	1	31,485
එකතුව		**17**	**631,660**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ii අත්‍යාවශ්‍ය අංශවල ඉන්ධන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග.

- ඉන්ධන පිරවුම්හල්වලින් බැහැරව කර්මාන්ත අංශයේ ඉන්ධන අවශ්‍යතාවය ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සෘජුවම සපයන ලදී. කර්මාන්ත සඳහා ඉන්ධන ලබා දීම විධිමත් කිරීම සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක් හඳුන්වා දෙන ලද අතර වඩා හොඳ පාලනයක් ඇති කිරීම සඳහා එම ලැයිස්තුව SAP ERP පද්ධතියට ඇතුළත් කර ඇත.

- කෘෂිකාර්මික හා ධීවර අංශවල ඉන්ධන අවශ්‍යතාවය කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය සහ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහාය ඇතිව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හඳුනාගත් ඉන්ධන පිරවුම්හල් හරහා සපයන ලදී. කෘෂිකාර්මික අංශය සඳහා ඉන්ධන සැපයීමේ ප්‍රගතිය 2.5 වගුව මගින්ද ධීවර අංශය සඳහා ඉන්ධන සැපයීමේ ප්‍රගතිය 2.6 වගුව මගින්ද දක්වා ඇත.

වගුව 2.5
තෝරාගත් ඉන්ධන පිරවුම්හල් මගින් කෘෂිකාර්මික අංශය සඳහා ඩීසල් සැපයීම (2022 - 2023)

අනු අංකය	දිස්ත්‍රික්කය	නිකුත් කළ ප්‍රමාණය (ලීටර්)
01	වවුනියාව	1,293,600
02	යාපනය	547,800
03	මන්නාරම	792,000
04	මුලතිව්	1,775,400
05	කිලිනොච්චි	1,452,000
06	ඔඩකලපුව	3,973,200
07	උම්පාර	9,253,200
08	ත්‍රිකුණාමලය	3,603,600
09	කුරුණෑගල	1,848,000
10	පුත්තලම	891,000
11	අනුරාධපුර	8,190,600
12	පොළොන්නරුව	7,134,600
13	මොණරාගල	1,900,800
14	බදුල්ල	2,329,800
15	රත්නපුර	963,600
16	කෑගල්ල	534,600
17	හම්බන්තොට	1,999,800
18	මාතර	1,075,800
19	ගාල්ල	712,800
20	කොළඹ	468,600
21	ගම්පහ	706,200
22	කළුතර	646,800
23	මාතලේ	910,800
24	නුවරඑළිය	6,600
25	නුවර	712,800
එකතුව		**53,724,000**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වගුව 2.6
ධීවර වරායන් සඳහා ඩීසල් සැපයීම (2022 ජනවාරි 01 - 2023 අප්‍රේල් 25)

අනු අංකය	ස්ථානය	නිකුත් කළ ප්‍රමාණය (ලීටර්)
01	පුරනවැල්ල	6,071,600
02	මිරිස්ස	6,580,200
03	ගාල්ල	9,484,200
04	බෙරුවල	6,645,800
05	ත්‍රිකුණාමලය - Codb	7,332,600
06	කුඩාවැල්ල	8,659,200
07	තංගල්ල	3,352,800
08	හික්කඩුව	1,894,200
09	කිරින්ද	396,000
10	කල්පිටිය	574,200
11	මොරටුව - Moder	59,400
12	හම්බන්තොට	1,788,600
13	අම්බලන්ගොඩ	3,082,200
14	මීගමුව	4,283,400
15	වාලච්චේන	3,458,400
16	දික්ඕවිට	13,134,000
17	නිල්වැල්ල	4,270,200
18	සුදුවැල්ල	3,082,200
19	මයිලඩි	930,600
එකතුව		**85,079,800**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

- ඇමරිකන් ඩොලර් මඟින් ගෙවීම් කිරීමට අවස්ථාව ලබා දීම මඟින් කරමින් ඉන්ධන මිලදී ගැනීම සඳහා අපනයනකරුවන් දිරිමත් කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරන ලදී. රට තුළට විදේශ විනිමය ගලා ඒම සහතික කිරීම සඳහා අපනයනකරුවන් වැඩි දායකත්වයක් දක්වන බැවින් මෙම කණ්ඩායම සඳහා වඩා ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී. අපනයනකරුවන්ට ඉන්ධන අලෙවි කිරීම මඟින් ඇමරිකන් ඩොලර් 38,430,975.18 ක මුදලක් 2022 මාර්තු සිට 2023 ජනවාරි දක්වා උපයන ලදී.

- පොදු ප්‍රවාහනය, සෞඛ්‍ය සේවා, විදුලි සංදේශ සේවා වැනි අත්‍යාවශ්‍ය සේවාවන්හි ඉන්ධන අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම සපුරාලීමට අමාත්‍යාංශය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රමාණවත් පියවර ගන්නා ලදී.

- සංචාරක කර්මාන්තයේ ඉන්ධන අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඩයලොග් ආසියාටා සමාගම හා සම්පත් බැංකුව ඒකාබද්ධව සංචාරක ඉන්ධන අවසරපත හඳුන්වා දෙන ලදී. මෙම ඉන්ධන අවසරපත්‍රය භාවිතා කරනු ලබන පුද්ගලයන් සඳහා අවශ්‍ය තරම් ඉන්ධන ලබා ගැනීමේ හැකියාව පවතින අතර, බලපත්‍රය සඳහා ගෙවීම් කිරීමට ඇමරිකන් ඩොලර් යොදාගනු ලැබේ. සංචාරක ඉන්ධන අවසර පත්‍රය මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය සපයා ගැනීමටද හැකියාව ලැබේ.

ජාතික ඉන්ධන අවසරපත හඳුන්වාදීම

සංචාරක ඉන්ධන අවසර පත (TFP)

ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ බොරතෙල් ගොඩබැමේ බෝයාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සපුගස්කන්ද තෙල් පිරිපහදුව

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ මුතුරාජවෙල තෙල් පර්යන්තය

ඉන්ධන පිරවුම්හල

2.10 රටෙහි බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් අංශය සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම

අ. 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත බලාත්මක කිරීම

1961 අංක 28 දරන ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත ක්‍රියාත්මක වීමත් සමඟ, ඛනිජ තෙල් පසුභාග කර්මාන්තයේ ඒකාධිකාරය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිමි විය. ඒ අනුව, ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු, අලෙවිකරුවෙකු, සැපයුම්කරුවෙකු හෝ බෙදාහරින්නෙකු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කරනු ලැබීය. එසේ වුවද මෙම ක්ෂේත්‍රය පුළුල් ප්‍රතිසංවිධානයකට ලක්කිරීමේ මූලික පියවරක් වශයෙන් තවත් තරඟකරුවන් හට ඛනිජ තෙල් ආනයනය කර බෙදාහැරීම සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම පිණිස 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත පනවන ලදී. එම පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවන ලද "බලශක්ති සැපයුම් කමිටුව" දෙවසරක කාල සීමාවකින් පසු බලරහිත වී ඇති බැවින් පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය වෙත නව ආයෝජකයන්ට පිවිසීමට ඇති අවස්ථාව අහිමි වී ඇත.

එයට පිළියමක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් බලතල හා කාර්යභාරයන්ට අගතියක් නොවන පරිදි ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම හා බෙදාහැරීම සඳහා පාර්ශවයන් තෝරාගැනීම පිණිස ප්‍රතිපාදන ඇතුළත් කරමින් 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතට සංශෝධන කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ අනුව 2022 අංක 27 දරන ඛනිජතෙල් නිෂ්පාදන

(විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත 2022.10.19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

ආ. දිගුකාලීන ගිවිසුම් මත පදනම්ව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, විකිණීම සහ බෙදාහැරීම සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත රටවල ඇති කීර්තිමත් සමාගම් තොරා ගැනීම.

2022 වසර තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් රට දැඩි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දුන් අතර එම තත්ත්වය තවදුරටත් අඛණ්ඩව පවතී. මෙම තත්ත්වය හේතුවෙන් ඉන්ධන ආනයනය අතිශය අභියෝගාත්මක විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම යන ආයතන දෙකට පමණක් ඉන්ධන ආනයනය කිරීමට අවසර දී ඇති අතර එම ආයතන ඉන්ධන ආනයනය කරනු ලබනුයේද දේශීය බැංකු පද්ධතිය හරහා ලබාගන්නා විදේශ විනිමය භාවිතා කරමිනි. විදේශ විනිමය අර්බුදය සමඟ, වෙළඳපොළට අඛණ්ඩව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා අවශ්‍ය විදේශ විනිමය නියමිත වේලාවට සුරක්ෂිත කර ගැනීමට මෙම ආයතන දෙකට නොහැකි විය. මෙම තත්ත්වය ප්‍රජාවගේ ජන ජීවිතය සහ ආර්ථික ක්‍රියාකාරකම්වල තිරසාරභාවය බරපතල ලෙස අනතුරට පත් කළේය.

විදේශ විනිමය අර්බුදය හේතුවෙන් අඛණ්ඩව ඉන්ධන සැපයීම සහතික කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමට නොහැකි වූ බැවින්, මෙරට විදේශ විනිමය සංචිත ප්‍රයෝජනයට නොගෙන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට සහ විකිණීමට අවස්ථාව සලසා දීම සඳහා උනන්දුවක් දක්වන කීර්තිමත් විදේශීය සමාගම් වෙතින් 2022.07.25 දින අභිලාෂ කැඳවන ලදී. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් මගින් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් පහත සඳහන් සමාගම් තුන ගිවිසුම් එකඟතාවයන් ඇති කර ගැනීම සඳහා තෝරාගෙන ඇත.

- සී/ස සයිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම (M/s Sinopec Fuel Oil Lanka (Private) Limited)
- සී/ස යුනයිටඩ් පෙට්‍රෝලියම් (පුද්ගලික) සමාගම (M/s United Petroleum (Pvt) Ltd)
- සී/ස ආර්. එම් පාර්ක් සමාගම (M/s R.M. Parks. Inc.)

ඇ. පිරිවැය ආවරණය කර ගැනීමේ පදනමින් ඉන්ධන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම

ජනතාව වෙත ආර්ථික සහන සැලසීමේ අරමුණින්, පිරිවැයට වඩා අඩු මිලකට දේශීයව ඛනිජ තෙල් නිෂ්පාදනයන් ලබා දීම බොහෝ අවස්ථාවල සිදු කරන ලදි. මෙලෙස ක්‍රියා කිරීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රවාහයන් විශාල ලෙස අඩු වූ අතර, එහි ණය බර ඉහළ යන ලදි. මෙම මූල්‍ය පීඩනය මගහරවා ගැනීම සඳහා පිරිවැය නිරූපණය වන පාරදෘශ්‍ය ඉන්ධන මිල යාන්ත්‍රණයක් 2022 ජූනි මස සිට හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, 2022 වර්ෂයේ ජූනි සිට පිරිවැය ගණනය කිරීම මත පදනම්ව මිල සංශෝධනය සිදුකරන ලදී. ඉන්ධන මිල යාන්ත්‍රණය හඳුන්වාදීමට පෙර සහ පසු ඉන්ධන මිලෙහි විචලනය ප්‍රස්තාරය 2.8 මගින් දැක්වේ. ඉන්ධන මිල යාන්ත්‍රණය හඳුන්වාදීමෙන් අනතුරුව ඩීසල් සහ පෙට්‍රල් අලෙවියෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය මත ඇති කරන ලද බලපෑම වගු අංක 2.7 මගින් දක්වා ඇත.

ප්‍රස්තාරය 2.8
බනිජ තෙල් නිෂ්පාදන විකුණුම් මිල සංශෝධන
(2021 ජූනි - 2023 මාර්තු 31)



ප්‍රස්තාරය 2.9
පිරිපහදු කළ බනිජ තෙල් බැරලයක මාසික
(සිංගප්පූරු ප්ලැට්ස්) මිල ගණන්
(2022 ජනවාරි - 2023 මාර්තු)



වගුව 2.7
පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය කෙරෙහි බලපෑම

මාසය	ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් ලාභය (රු. මි.)	මෙහෙයුම ලාභය සඳහා පෙට්‍රල් සහ ඩීසල් දායකත්වය (රු. මි.)	ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභය (රු. මි.)
2022 ජූනි	7,425	430	(679)
2022 ජූලි	9,974	5,137	6,314
2022 අගෝස්තු	9,569	7,721	1,776
2022 සැප්තැම්බර්	16,342	12,787	5,629
2022 ඔක්තෝම්බර්	10,910	8,859	1,963
2022 නොවැම්බර්	13,872	12,418	5,310
2022 දෙසැම්බර්	4,749	6,561	3,932
2023 ජනවාරි	10,134	7,654	3,865
2023 පෙබරවාරි	12,508	10,851	9,434

සටහන ඉහත තොරතුරු මාසික කළමනාකරණ ගිණුම් මගින් සහ දෙසැම්බර් මස අගයන් වසර අවසන් ගැලපුම්වලින් පසු අගයන් වේ.

මූලාශ්‍රය: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව

ඉ. ජාතික ඉන්ධන අවසරපත හඳුන්වා දීම

රටතුළ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කිරීමේ අරමුණින් සහ පැවති සීමිත ඉන්ධන තොග බෙදා හැරීම පාලනය කිරීම සඳහා 12 ජූලි මාසයේ සිට ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව මේ වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම සතු සියළුම ඉන්ධන පිරවුම්හල් මඟින් මහජනතාව වෙත ඉන්ධන නිකුත් කිරීම ජාතික ඉන්ධන අවසරපත් ක්‍රමවේදයට අනුකූලව මනා කළමනාකරණයකින් යුතුව සිදු කරනු ලබයි.

ජාතික ඉන්ධන අවසරපත හඳුන්වාදීම සඳහා මෙරට ප්‍රමුඛ පෙළේ තාක්ෂණ ආයතන ත්‍රිත්වයක් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), මිලේනියම් අයි. ටී. ඊ. එස්. පුද්ගලික සමාගම සහ ඩයලොග් ආසියාටා පුද්ගලික සමාගම තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී.

රටේ සාර්ව ආර්ථික සාධකය ස්ථාවර වන තුරු සහ ගෙවුම් ශේෂ තත්ත්වය තිරසාර මට්ටමක් දක්වා වැඩිදියුණු වන තෙක් ජාතික ඉන්ධන අවසරපත් ක්‍රමය වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට තීරණය කර ඇත. එබැවින් බලශක්ති ක්ෂේත්‍රය සඳහා යෝජිත ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන ප්‍රතිඵල මත පදනම්ව රජය මෙම ක්‍රමවේදය ඉවත් කිරීමට තීරණය කරනු ලබන්නේ නම් මිස 2023 වර්ෂය තුළ ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය කිසිදු වෙනසකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

වගුව 2.8
ජාතික ඉන්ධන අවසරපත මඟින් සිදුකළ ගනුදෙනු සාරාංශය
(2022 අගෝස්තු 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)

සැපයුම්කරු	පිරවුම්හල් සංඛ්‍යාව	ගනු දෙනු සංඛ්‍යාව	පාරිභෝජනය කළ ලීටර් ප්‍රමාණය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	1,059	105,452,090	675,784,365
ලංකා ඉන්දියානු තෙල් සමාගම	207	19,083,631	135,168,909
එකතුව	**1,266**	**124,535,721**	**810,953,274**

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ICTA

වගුව 2.9
ජාතික ඉන්ධන අවසර පත මඟින් ඉන්ධන නිකුත් කිරීම
(වාහන වර්ගය අනුව)
(2022 අගෝ. 01 සිට 2022 දෙසැ. 31 දක්වා)

වාහන වර්ගය	ලියාපදිංචි වාහන සංඛ්‍යාව	ගනු දෙනු සංඛ්‍යාව	පරිභෝජනය කළ ලීටර් ප්‍රමාණය
ත්‍රිරෝද රථ	1,070,596	24,213,143	81,692,874
යතුරුපැදි	3,715,316	68,590,175	205,907,394
බස්	58,877	1,294,289	48,832,988
මෝටර් රථ	752,934	16,674,711	190,762,241
ඉඩම් වාහන	63,278	392,409	4,128,653
ලොරි රථ	330,320	7,028,252	187,598,270
කුවාඩ්‍රිසයිකල්	1,584	24,458	84,216
විශේෂ වාහන	97,261	987,339	19,390,232
වෑන් රථ	329,903	5,330,945	72,556,406

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය ICTA

2.11 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

අ. ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම

ත්‍රිකුණාමලය චීන වරායේ තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් පැවති ගැටලුව නිරාකරණය කරමින්, මුදල් අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) සහ අලුතින් පිහිටුවන ලද ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් සමාගම (TPTL) යන ආයතන තෙල් ටැංකි සංකීර්ණයේ සන්තකය, සංවර්ධනය කිරීම සහ භාවිතය සඳහා වූ ගිවිසුමකට 2022 ජනවාරි 06 වැනි දින අත්සන් කරන ලදී. ඒ අනුව ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමට අදාල පාර්ශ්වයන් විසින් පහත පරිදි සැලසුම් කර ඇත.

වගුව 2.10
ත්‍රිකුනාමලය තෙල් ටැංකි සංකීරණය සංවර්ධනය කිරීම

ආයතනය	ටැංකි සංඛ්‍යාව	ස්ථානය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	24	ඉහළ ටැංකි සංකීර්ණය
ලංකා ඉන්දියානු තෙල් සමාගම	14	පහළ ටැංකි සංකීර්ණය
ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ඔයිල් සමාගම	61	ඉහළ ටැංකි සංකීර්ණය

මූලාශ්‍රය: විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

2022 වර්ෂයේදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කරන ලද අතර, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන මූලික ඉඩම් එළිපෙහෙළි කිරීම් සහ ඉඩම් මැනීමේ කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

ආ. කටුනායක ගුවන් තොටුපොළේ ගුවන් යානා ඉන්ධන සැපයුම් පද්ධතිය (Fuel Hydrant System) සංවර්ධනය කිරීම

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ජෙට් ඒ-1 ගුවන් යානා ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම, ඉන්ධන සැපයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි II වන අදියරේ 2 වන පියවරේ සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව මෙම ව්‍යාපෘතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආරම්භ කරන ලදි.

ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 51.5 ක බදු රහිත මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර ව්‍යාපෘතිය මූල්‍යනය කොන්ත්‍රාත් වටිනාකමින් 85% චීන ජාතික වෙමිකල් ඉංජිනියරින් ඉදිකිරීම් (China National Chemical Engineering Construction) ආයතනයේ සහාය දක්වන ස්වයං මූල්‍යකරණ පහසුකමින් ආවරණය කරන ලදි. ඉතිරි 15% මහජන බැංකුවේ ණය පහසුකමකින් ආවරණය කෙරේ. 2022.12.31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 75.6% ක් අත් කර ගෙන ඇති අතර මූල්‍ය ප්‍රගතිය 69.33% කි. ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2023.05.31 නිම කිරීමට සැලසුම් කර ඇත.

ඇ. ද්‍රවීකෘත ස්වභාවික වායු ප්‍රවාහන නළ මාර්ගය ඉදිකිරීම

පාවෙන ගබඩා ප්‍රතිවායුකරණ (FSRU) ඒකකය සහ මූරින් (Mooring) පද්ධතිය ඉදිකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයට සමගාමීව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කෙරවලපිටිය වෙරළ තීරයට කිලෝමීටර් 5 ක් පමණ දුරින් පිහිටි යෝජිත පාවෙන ගබඩා ප්‍රතිවායුකරණ (FSRU) ඒකකයේ සිට කැලණිතිස්ස සහ කෙරවලපිටිය විදුලි බලාගාර දක්වා ද්‍රවීකෘත ස්වභාවික වායු ප්‍රවාහන නළ මාර්ගයක් (''ඉදිකිරීම, අයිතිකර ගැනීම, මෙහෙයවීම සහ පැවරීමේ" පදනම මත) ඉදිකිරීම සඳහා යෝජනා කැඳවන ලදි.

ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය

i. කෙටි ලැයිස්තුගත ව්‍යාපෘති යෝජක සමඟ සාකච්ඡා සාර්ථක මට්ටමක පවතින අතර නළ මාර්ග පද්ධති ගිවිසුම (PSIA) අවසන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද සාඛච්ඡා කමිටුවේ තීරණය අපේක්ෂාවෙන් සිටින අතර එම ගිවිසුම සඳහා ගරු නීතිපතිතුමාගේ එකඟතාවය ලබා ගත යුතුය. නල මාර්ග පද්ධති ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම (PSIA) 2022.09.29 දින භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලදී.

ii. පාර්ශවකරුවන්ගේ සහාය ලබා දෙමින් පවතී.

iii. මුදල් අමාත්‍යාංශය නිකුත් කරන ලද අංක 2022/03 දරණ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය සහ අංක 2022/04 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු තාවකාලිකව නතර කරන ලදි. ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා 2022.09.27 දින යොමු කරන ලදි.

iv. ලංසුවේ වලංගු කාලය 2023.12.25 දක්වා දීර්ඝ කරන ලද අතර ලංසු ආරක්ෂණ ඇපකරයේ වලංගු කාලය 2024.01.25 දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

ඇ. කොලොන්නාව පර්යන්තයේ සමස්ත ධාරිතාවය ඝන මීටර් 93,000 කින් යුත් ඉන්ධන තොග ගබඩා ටැංකි 09 ක් ඉදිකිරීම

වාර්ෂික ඉන්ධන ඉල්ලුම 5% ක් පමණ වැඩිවීමක් සාමාන්‍යයෙන් දක්නට ලැබෙන බැවින් එම තත්ත්වයට මුහුණ දීම සඳහා සෑම ඛනිජ තෙල් නිෂ්පාදනයක්ම අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් තොග වශයෙන් ගබඩා කර තබා ගැනීමේ පහසුකම වර්ධනය කර ගත යුතුය. ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූලික කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට එරෙහිව අතුරු තහනම් නියෝගයක් ලබා ගෙන ඇති අතර ටැංකි ඉදිකිරීමේ සමස්ත ප්‍රගතිය 18% කි. තවද ටැංකි 03 ඉදිකිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 942.5 ක බදු රහිත මුදලකට 2020.11.12 දින කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර ව්‍යාපෘති කාලය මාස 20 කි. මේ වන විට ටැංකි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

ඉ. කොලොන්නාව පර්යන්තයේ ටැංකි අලුත්වැඩියා කිරීම

නව තාක්ෂණයට හා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පවත්නා ටැංකි පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අලුත්වැඩියා කටයුතු සිදු කරන අතර 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය 2.11 වගුව මගින් දක්වා ඇත.

වගකීම බැවින් මෙම සමාගම කොලොන්නාව පර්යන්තයේ සම්පූර්ණ ධාරිතාව ඝන මීටර් 64,000 යුතු ටැංකි 06ක් සහ සම්පූර්ණ ධාරිතාව ඝන මීටර් 29,000 යුතු ටැංකි 03 ක් ලෙස අදියර දෙකක් යටතේ ඉන්ධන ගබඩා ටැංකි 09ක් ඉදිකිරීමට පියවර ගන්නා ලදී.

ඉන්ධන ටැංකි 6ක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 2,286.8 ක බදු රහිත කොන්ත්‍රාත් මුදලකට 2019.10.24 දින ප්‍රදානය කළ අතර ව්‍යාපෘති කාලය මාස 40 කි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් කොන්ත්‍රාත්තුව ඉදිරියට ගෙන යාමට නොහැකි වූ අතර 2022.01.19 දින කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී.

වගුව 2.11
කොලොන්නාව පර්යන්තයේ ටැංකි අලුත්වැඩියා කිරීමේ ප්‍රගතිය (2022.12.31 දිනට)

ටැංකි අංකය	ගබඩා ධාරිතාවය (ඝණ මීටර්)	ඇස්තමේන්තු ගත මුදල රු.මි. (බදු රහිත)	වර්තමාන භෞතික ප්‍රගතිය (2022.12.31 දිනට)
03	12,500	රු. 40 Mn	100%
17	4,936	රු. මිලියන 30 + USD 35,400	100%
22	2,790		100%
46	11,856	Rs. 133 Mn	100%

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ඊ. කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා දිවෙන විෂ්කම්භය 14" නළ මාර්ගය ප්‍රතිසංස්කරණය

ඉන්ධන ප්‍රවාහනය සඳහා පවත්නා නළ මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතී. එබැවින් කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා දිවෙන විෂ්කම්භය 14, වූ මීටර් 5,750 ක් දිග නළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 2021 දී ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 95 ක ඇස්තමේන්තුගත මුදලක් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් වෙන් කරන ලද අතර එමගින් 2022.12.31 වන විට 70% පමණ භෞතික ප්‍රගතියක් අත් කර ගන්නා ලදී. ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු 2023.05.30 දින වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.

2.12 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම සහ අලෙවි කිරීමේ ප්‍රගතිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හරහා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීමට කටයුතු කිරීම මගින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය රටේ සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ලැබේ. පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට හැකිවන පරිදි ගුණාත්මක හා නව්‍ය නිෂ්පාදන ආනයනය කිරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැමවිටම සහතික කරන ලදි.

අ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම

COVID 19 වසංගතය සහ රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් 2020 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ බොරතෙල් ආනයන ප්‍රමාණයෙහි අඩුවක් දක්නට ලැබේ. 2022 වර්ෂයේ බොරතෙල් ආනයනය 2021 වසරේ බොරතෙල් ආනයන ප්‍රමාණය හා සසඳන විට 34% කින් අඩු වී ඇත. කෙසේ වෙතත්, 2022 වර්ෂයේ දී බොරතෙල් ආනයන පිරිවැය 2021 ට සාපේක්ෂව 78% කින් පමණ වර්ධනය වී ඇත. 2.12 වගුව මගින් 2018 සිට 2022 දක්වා බොරතෙල් ආනයන සහ 2.13 වගුව මගින් 2020 සිට 2022 දක්වා පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

වගුව 2.12
බොරතෙල් ආනයනය (2018 - 2022)

වර්ෂය	ප්‍රමාණය (මෙ. ටො. 000)	පිරිවැය (DAP) රු.මි.
2018	1,763	160,933
2019	1,843	172,542
2020	1,666	98,277
2021	1,130	101,306
2022	743	180,019

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

වගුව 2.13
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2020 - 2022)

නිෂ්පාදනය	ප්‍රමාණය (මෙ. ටො.) ('000)		
	2020	2021	2022
ඔටෝ ඩීසල්	951	1,254	1,267
සුපර් ඩීසල්	56	68	128
පෙට්‍රල් - 92 ඔක්ටේන්	837	893	888
පෙට්‍රල් - 95 ඔක්ටේන්	91	103	46
ගුවන් යානා ඉන්ධන	101	178	269
අඩු සල්ෆ දැව්තෙල් (180 CST)	206	245	124
වැඩි සල්ෆ දැව්තෙල් (180 CST)	146	31	-
එකතුව	**2,388**	**2,772**	**2,722**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

ආ. සපුගස්කන්ද ඛනිජ තෙල් පිරිපහදු මෙහෙයුම් - 2022

සපුගස්කන්ද ඛනිජ තෙල් පිරිපහදුව මගින් 2022 දී මර්බන් බොරතෙල් මෙට්‍රික් ටොන් 1,855,000 ක් සැකසීමට සැලසුම් කරන ලදී. 2022 වර්ෂය තුළ බොරතෙල් මෙට්‍රික් ටොන් 529,773 ක් යොදා ගනිමින් ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික් ටොන් 482,875 ක් නිෂ්පාදනය කර ඇත. එපමණක් නොව, රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් මර්බන් බොරතෙල්, යූරල් බොරතෙල්, සයිබීරියානු ලයිට් බොරතෙල් සහ එස්පෝ බොරතෙල් මිශ්‍රණය පිරිපහදු කරන ලදී. පිරිපහදුවෙහි, මෙහෙයුම්වල සැලසුම්කල ධාරිතාව සහ සත්‍ය පිරිපහදු ධාරිතාව 2.14 වගුව මඟින් නිරූපරණය වේ.

වගුව 2.14

සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ කාර්යසාධනය -2022

යෙදවුම්	ඒකක	ධාරිතාව - 2022	
		ඇස්තමේන්තුගත (මර්බන්) **	සත්‍ය *
බොරතෙල්	MT	1,855,000	529,773
තාර නිෂ්පාදනය සඳහා හයිසල්ෆර් ෆුවල් ඔයිල්	MT	87,500	0
නිෂ්පාදන			
සුපර් පෙට්‍රල්	MT	187,790	38,666
භූමිතෙල්	MT	66,780	25,289
නැප්තා	MT	158,044	30,835
ඩීසල්	MT	608,253	128,165
ජෙට් ඒ - 1	MT	267,120	57,346
දැවිතෙල් (800 Sec)	MT	485,100	87,196
දැවිතෙල් (1500 Sec)	MT		107,001
එල් පී ගෑස්	MT	25,200	5,687
ලංකා සොල්වන්ට්	MT	1,404	2,690
තාර	MT	39,550	0
මුළු නිෂ්පාදනය	**MT**	**1,839,241**	**482,875**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

වගුව 2.15

ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ ඉන්ධන පිරිපදුවෙහි නිෂ්පාදන ප්‍රමාණය (මෙ. ටො.) (2018 - 2022)

වර්ෂය		2,018	2019	2020	2021	2022
බොරතෙල් යෙදවුම් ප්‍රමාණය		**1,703,307**	**1,902,357**	**1,685,441**	**1,272,207**	**529,773**
නිමැවුම්	පෙට්‍රල්	165,425	185,915	164,416	124,092	38,666
	ඔටෝ ඩීසල්	567,577	624,462	537,645	370,594	128,165
	දැවිතෙල් - 800 sec	423,197	468,843	465,419	359,021	87,196
	දැවිතෙල් - 1500 sec	-	-	-	-	107,001
	භූමි තෙල්	35,195	8369	109,165	98,284	25,289
	වෙම්කල් නැප්තා	140,619	162,019	156,953	106,956	30,835
	තාර	12,839	17,103	13,561	6,879	-
	ගෑස් (LPG)	22,084	26,988	25,251	16,650	5,687
	ගුවන් යානා ඉන්ධන	237,270	258,986	157,279	130,572	57,346
	ලංකා සොල්වන්ට්	1,596	1,660	897	3,037	2,690
මුළු නිමවුම්		**1,605,802**	**1,754,345**	**1,630,586**	**1,216,085**	**482,875**

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

ඇ. බනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

විවිධ බනිජ තෙල් නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම මූලික වශයෙන් ඒවායේ විභව භාවිතය මත වෙනස් වේ. උදාහරණයක් ලෙස, ඔටෝ ඩීසල් ප්‍රවාහනය සහ බලශක්ති උත්පාදනය සඳහා බහුලව භාවිතා වන අතර භූමිතෙල්, ග්‍රාමීය ගෘහස්ත බලශක්ති අවශ්‍යතා, කාර්මික යෙදුම්, කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය සඳහා පමණක් භාවිතා වේ. එබැවින් භූමිතෙල්වලට සාපේක්ෂව ඔටෝ ඩීසල් සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගනී. 2019 සිට 2022 දක්වා බනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි පිරිපහදු කළ බනිජ තෙල් නිෂ්පාදනවල අලෙවිය 2.16 වගුව මඟින් දැක්වේ.

අඛණ්ඩව පවත්වාගෙනයාම සහ නියාමනය කිරීම සඳහා ආයතනයේ සමාරම්භක පරිපාලන, මානව සම්පත්, මූල්‍ය සහ තාක්ෂණික කාර්යයන් පිහිටුවීමට පියවර ගත් වසරක් වූ බැවින් 2022 වසර නව අධිකාරියට ඉතා වැදගත් විය. එලෙස ළඟාකර ගත්, බනිජ තෙල් හා ස්වභාවික වායු ගවේෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා බනිජතෙල් සංවර්ධන අධිකාරිය, අමාත්‍යාංශය සමඟ එක්ව, 2021 අංක 21 දරන බනිජ තෙල් සම්පත් පනතින් නියම කර ඇති ගවේෂණ සඳහා ආයෝජන පහසු කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස්කරන ලදි. බනිජ තෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන

වගුව 2.16
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අලෙවිය (මෙ. ටො.) (2019 - 2022)

නිෂ්පාදන වර්ගය	මුළු විකුණුම්			
	2019	2020	2021	2022
ලංකා පෙට්‍රල් - 92 ඔක්ටේන්	1,184,944	1,005,013	1,102,551.7	964844.219
ලංකා පෙට්‍රල් - 95 ඔක්ටේන්	135,747	99,950	102,809.5	55697.245
ලංකා ඔටෝ ඩීසල්	1,890,806	1,562,144	1,706,041.8	1475577.154
ලංකා සූපර් ඩීසල්	67,373	57,413	65,721.5	72474.383
ලංකා භූමිතෙල්	202,809	171,441	185,312.6	98367.966
ලංකා කාර්මාන්ත භූමිතෙල්	3,324	1,902	2,903.3	5647.035
ලංකා රසායනික නැප්තා	124,596	1,590,582	333,459.2	32262.861
ලංකා දැව් තෙල් 800	137,737	-	99,321.8	-
ලංකා දැව් තෙල් 1500 (වැඩි සල්ෆර්)	171,099	203,251	340,198.0	198891.936
ලංකා දැව් තෙල් 1500 (අඩු සල්ෆර්)	99,779	30,246	407,868.4	103379.876
ලංකා දැව් තෙල් - සූපර්	472,876	591,162	203,994.2	54978.319
ජෙට් ඒ-1	473,458	188,618	223,666.3	245796.923
ලංකා සොල්වන්ට් (SBP)	1,274	796	2,486.5	2701.635
එකතුව	**4,965,822**	**5,502,518**	**4,776,334.80**	**3,310,619.55**

මූලාශ්‍රය: ලංකා බනිජ තෙල් නිතිගත සංස්ථාව

2.13 බනිජ තෙල් සහ ස්වභාවික වායු ගවේෂණ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

ශ්‍රී ලංකා බනිජ තෙල් සංවර්ධන අධිකාරිය 2021 අංක 21 දරන බනිජ තෙල් සම්පත් පනත යටතේ 2021 ඔක්තෝම්බර් 8 වැනි දින පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ හයිඩ්‍රොකාබන් ගවේෂණය ක්‍රියාවලිය ගිවිසුම්) රෙගුලාසි, 2023 අංක 1 දරන සහ 2023 අංක 2 දරන බනිජ තෙල් සම්පත් (සේවා සපයන්නන්ගේ බලපත්‍ර) රෙගුලාසි සකස් කිරීම 2022 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී. තවද, 2023 අංක 3 දරන ශ්‍රී ලංකාවේ හයිඩ්‍රොකාබන් ගවේෂණ කටයුතු සඳහා දත්ත උත්පාදනය කිරීම සම්බන්ධ රෙගුලාසි සහ 2023 අංක 4 දරන

දත්ත බලපත්‍ර සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීමද අවසන් වෙමින් පවතී.

ආ. යාවත්කාලීන කරන ලද, ශ්‍රී ලංකාවේ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් කොටස් සිතියම 2022 ජූලි 11 වැනි දින ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒකාබද්ධ අධ්‍යයනය, ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදනය සඳහා පහසුකම් සලසන මෙම සිතියම ද්‍රෝණිණි තුනම ආවරණය වන ලෙස (මන්නාරම ද්‍රෝණිය - (MB001 - MB294), කාවේරි ද්‍රෝණිය - (CB001 - CB069), ලංකා ද්‍රෝණිය - (LB501 - LB509) ආසන්න වශයෙන් 15කි.මී x 15කි.මී ජාලයක කුඩා බිම් කොටස් 922කින් සමන්විත වේ.

ඇ. ස්ලම්බර්ජර් (Schlumberger) සහ බෙල් ජියෝස්පේස් (Bell Geospace) සමාගම් විසින් බහු-සේවාදායක ඛනිජතෙල් දත්ත සැකසීම සහ නැවත සැකසීම, අලෙවිකරණය සහ දත්ත බලපත්‍ර වැඩසටහන් අඛණ්ඩව සිදු කරන ලදි. මෙම සමාගම් මඟින් ලන්ඩනයේ පැවත SEAPEX/PESGB ආසියා පැසිෆික් විදුලිබල හා බලශක්ති සමුළුව ඇතුළු ජාත්‍යන්තර සම්මන්ත්‍රණ කිහිපයකදී ශ්‍රී ලංකා බහු සේවාදායක ඛනිජතෙල් දත්ත ප්‍රවර්ධනය කරන ලදී.

ඉ. ශ්‍රී ලංකාවේ මන්නාරම සහ කාවේරි ද්‍රෝණියේ තෝරාගත් ප්‍රදේශවල හයිඩ්‍රොකාබන් විභවය තක්සේරු කිරීම සම්බන්ධයෙන SDDT තාක්ෂණයේ සඵලතාවය සමාලෝචනය කිරීමේ අරමුණින් ජර්මනියේ පයිතියාස් (Pytheas) විසින් ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයනයක් සඳහා පහසුකම් සපයන ලදී.

ඊ. ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය, බහු සේවාදායක ඛනිජතෙල් දත්ත හවුල්කරුවන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කරමින් ශ්‍රී ලංකාව වෙත නව ආයෝජක උනන්දුව ඇති කරලීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය වෙත ලැබුණු ඛනිජතෙල් දත්ත විකුණුම්වල හවුල්කාර කොටස (ඇ.ඩො.683,975.75) ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අරමුදල වෙත යොමු කර ඇත.

2.14 2022 වසර තුළදී මුහුණ දුන් අභියෝග හා ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග

ඛනිජ තෙල් හා ගල් අඟුරු ප්‍රසම්පාදනය

2022 වර්ෂයේ ගෝලීය වශයෙන් පැවති භූ දේශපාලනික (විශේෂයෙන්ම රුසියා යුක්‍රේන යුද්ධය) අර්බුද හා ආර්ථික බිඳවැටීම් හේතුවෙන් ඛනිජ තෙල් හා ගල් අඟුරු නිෂ්පාදනය අඩුවී අනපේක්ෂිත ලෙස ජාත්‍යන්තර වෙළඳපොලේ ඛනිජ තෙල් හා ගල් අඟුරු මිල ගණන් ඉහළ නැගුනි. මෙම වාතාවරණය හේතුවෙන් ඛනිජ තෙල් හා ගල් අඟුරු ආනයනය කිරීම අර්බුදකාරී වූ අතර මෙරට විදේශ විනිමය සංචිත දුර්වලවීම හේතුවෙන් මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර විය. තවද ජාත්‍යන්තර මූල්‍ය ශ්‍රේණිගත කිරීමේදී ශ්‍රී ලංකාව පහත ශ්‍රේණියකට ඇදවැටීම සහ ණයවර ලිපි විවෘත කිරීමට තෙවන පාර්ශවීය ජාත්‍යන්තර බැංකු තහවුරුවක් ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඛනිජ තෙල් හා ගල් අඟුරු ප්‍රසම්පදනයේදී අවශ්‍ය ණයවර ලිපි විවෘත කිරීම බරපතල ගැටලුවක් විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය මුහුණ දුන් ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් දේශීය මුදල් සම්පාදනය ද අපහසු විය. මේ නිසා ඛනිජ තෙල් හා ගල් අඟුරු සැපයුම්කරුවන් ආනයන සඳහා පූර්ව ගෙවීම් සිදුකරන ලෙස ඉල්ලා සිටීම මෙන්ම ප්‍රසම්පාදන කටයුතු ගැටළුකාරී විය. එසේම ලංසු නියමිත පරිදි ඉදිරිපත් නොවීම ද දැඩි ගැටලුවක් විය. මෙම ගැටලුකාරී වාතාවරණය මධ්‍යයේ ගනු ලැබූ පහත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රට තුළ අඛණ්ඩ විදුලි සැපයුමක් සහ ඛනිජ තෙල් සැපයුමක් සහතික කිරීමට හැකියාව ලැබිණි.

- පවතින අර්බුදකාරී තත්ත්වය පහව යන තුරු ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් හා සම්මත ලංසු ලේඛනවල කොන්දේසිවලින් බැහැරවීම් පැවතිය දී වුවද මූල්‍ය වශයෙන් වඩා යෝග්‍ය ප්‍රසම්පාදන තීරණවලට එළඹීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කටයුතු කිරීම.

- ඛනිජ තෙල් සැපයීම සඳහා ඉදිරිපත් කරන ලද නොකැඳවූ යෝජනා (unsolicited proposals) ඇගයීමට ලක් කර වඩා වාසිදායක යෝජනා සලකා බැලීමට කටයුතු කිරීම.

